**මුදල් කොමිෂන් සභාව**

**நிதி ஆணைக்குழு**

**Finance Commission**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (4) ව්‍යවස්ථාව ප්‍රකාරව

# ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලබන නිර්දේශ - 2023

*இலங்கை ஜனநாயக சோசலிசக் குடியரசின் அரசியலமைப்பின்*
*உறுப்புரை 154 R (4) பிரகாரம்*

# 2023 ஆம் ஆண்டிற்கு சமர்ப்பிக்கப்பட்ட கௌரவ ஜனாதிபதிக்கான பரிந்துரைகள் - 2023

# RECOMMENDATIONS TO THE HON. PRESIDENT - 2023

In terms of the Article 154 R (4) of the Constitution of the

Democratic Socialist Republic of Sri Lanka

**2022 ඔක්තෝබර් මස 07**

07 ஒக்ரோபர் 2022

**07th October 2022**

# මුදල් කොමිෂන් සභාව

(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 "ජ" ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලදී.)

# நிதி ஆணைக்குழு

(அரசியலமைப்பின் 154 "ண" ஆம் உறுப்புரையின் கீழ் தாபிக்கப்பட்டது)

# FINANCE COMMISSION

(Established under Article 154 "R" of the Constitution)

03, සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව.
இல. 03, சரண மாவத்தை, ராஜகிரிய, இலங்கை.
03, Sarana Mawatha, Rajagiriya, Sri Lanka.


මගේ අංකය / எனது இல. / My No. FC/PRP/08/01/2022

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022.10.07

ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

ගරු ජනාධිපතිතුමනි,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (4) ව්‍යවස්ථාව ප්‍රකාරව "පළාත් සඳහා ආණ්ඩුව විසින් වාර්ෂිකව ප්‍රදානය කරනු ලබන අරමුදල් පළාත් අතර බෙදා දීමේදී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති" පිළිබඳව වූ නිර්දේශ මුදල් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කළ යුතු වේ.

ඒ අනුව, 2023 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශිත පරිදි පළාත් සභා වෙත වාර්ෂික අයවැයෙන් වෙන් කරනු ලබන අරමුදල් පළාත් සභා අතර බෙදා වෙන් කර දීම සම්බන්ධයෙන් වූ මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ මේ සමඟ කාරුණිකව ඉදිරිපත් කරමි. පළාත් මට්ටමෙන් සම්පත් වෙන් කරදීමේ හා සේවා සැපයීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා වන යෝජනා කිහිපයක් ද මෙම වාර්තාවේ ඇතුළත් වේ.

මෙයට විශ්වාසී,

සුමිත් අබේසිංහ
සභාපති
මුදල් කොමිෂන් සභාව


සභාපති / தலைவர் / Chairman (+94)011 2866724
ලේකම් / செயலாளர் / Secretary (+94)011 2866824
කාර්යාලය / அலுவலகம் / Office (+94)011 2866747
ෆැක්ස් / தொலைநகல் / Fax (+94)011 2866671 (+94)011 2866679
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail info@fincom.gov.lk
www.fincom.gov.lk

# මුදල් කොමිෂන් සභාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (4) ව්‍යවස්ථාව ප්‍රකාරව

## ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලබන නිර්දේශ - 2023

**2022 ඔක්තෝබර් 07**

පටුන

පිටු අංකය.

**අන්තර්ගතය**


| | |
|---|---|
| 01.හැඳින්වීම | 01 |
| 02. පළාත් සභා සඳහා සම්පත් වෙන් කිරිම | 04 |
| 03. 2023 වර්ෂය සඳහා පළාත් සභාවන්හි ප්‍රාග්ධන හා පුනරාවර්තන අවශ්‍යතා තක්සේරුව හා පළාත් සභා අතර ප්‍රදානයන් බෙදා හැරීම සම්බන්ධ නිර්දේශ | 07 |
| 04. පළාත් මට්ටමින් සිදු කෙරෙන සම්පත් වෙන් කිරීමේ හා සේවා සැපයීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා වන යෝජනාවන් | 17 |


ඇමුණුම


| | |
|---|---|
| 01. පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා, නිර්දේශ කිරීම, අයවැය වෙන් කිරීම, හා අක්මුදල් නිදහස් කිරීම (2017-2021) | 24 |

## 1 වන පරිච්ඡේදය

## හැඳින්වීම

### 1.1 පසුබිම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (3) අනුව්‍යවස්ථාවට අනුකූලව, රජය විසින් පළාත් සභා සඳහා අරමුදල් වෙන් කිරීමට හැකි වන පරිදි සම්පත් අවශ්‍යතා තක්සේරු කිරීම සම්බන්ධයෙන් ද එළඹෙන වසර සඳහා එසේ වෙන් කර දෙනු ලබන අරමුදල්, තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (4) අනුව්‍යවස්ථාවට අනුව විවිධ පළාත් අතර වෙන් කර දීමට අදාල වන මූලධර්ම සම්බන්ධයෙන් ද වන නිර්දේශ, මෙම වාර්තාවෙන් ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කෙරේ. එමෙන්ම පළාත් මට්ටමින් සම්පත් වෙන් කිරීමේත්, සේවා සැපයීමේත් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා වන නිර්දේශ ද මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

### 1.2 මුදල් කොමිෂන් සභාව

1987 වර්ෂයේ දී සම්මත කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය මගින් පළාත් සභා ස්ථාපිත කිරීමත් සමඟම මුදල් කොමිෂන් සභාව ද ස්ථාපිත කරන ලදී. පළාත් සභා ස්ථාපිත කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154අ - 154ච ව්‍යවස්ථාවන්ට අනුකූලව, එකී ආයතනයන්හි නිසි ක්‍රියාකාරීත්වය සඳහා පුළුල් පාලන රාමුවක් නිර්මාණය කිරීම පිණිස 1987 අංක 42 දරණ පළාත් සභා පනත පනවන ලදී. පළාත් සභාවන්ට පවරා ඇති විෂයයන් සම්බන්ධයෙන් ඔවුන්ගේම මූල්‍ය ප්‍රඥප්ති සහ අනෙකුත් ප්‍රඥප්ති සම්පාදනය කිරීමත් සමඟ, පසුගිය වසර 35 තුළ ක්‍රමිකව විකාශනය වූ පුළුල් පාලන රාමුවක් සහ ආයතනික සැකැස්මක් එකී ආයතන සතුව ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ I ලැයිස්තුවේ සඳහන් බලය බෙදා හැරුණු විෂයයන් සම්බන්ධයෙන් මෙන්ම, එම උපලේඛනයේ III ලැයිස්තුවේ (සමගාමී ලැයිස්තුවේ) සඳහන් හවුල් වගකීම් පිළිබඳ විෂයයන් සම්බන්ධයෙන් ද සේවා සැපයීමේ වගකීම පළාත් සභා සතු වේ. වර්තමානයේදී පළාත් සභා සතු ආදායම ඉතා අල්ප බැවින්, පළාත් සභාවල සේවා සැපයීම සඳහා අවශ්‍ය සම්පත් වලින් විශාල කොටසක් සපයා ගනු ලබන්නේ, මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ මත ජාතික අයවැයෙන් වෙන් කරනු ලබන ප්‍රතිපාදන මගිනි.

### 1.3 මුදල් කොමිෂන් සභාවේ කාර්යයභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ ව්‍යවස්ථාවෙහි මුදල් කොමිෂන් සභාව පිහිටුවීම සඳහා වන ප්‍රතිපාදන සඳහන් වන අතර, මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය ද පැහැදිලි කර ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (3), (4) සහ (5) අනුව්‍යවස්ථාවල නිශ්චිතව දක්වා ඇති පරිදි, මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය පහත ආකාරයෙන් වේ.

154 ජ (3) අනුව්‍යවස්ථාව: "පළාත්වල අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් අරමුදල්, ආණ්ඩුව විසින් මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය අනුව සහ කොමිෂන් සභාව විමසා වාර්ෂික අයවැය ලේඛනයෙන් වෙන් කර දිය යුත්තේය".

154 ජ (4) අනුව්‍යවස්ථාව:

"අ) පළාත් සඳහා ආණ්ඩුව විසින් වාර්ෂිකව ප්‍රදානය කරනු ලබන අරමුදල් පළාත් අතර බෙදාදීමේදී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති

ආ) පළාත්වල මුදල් කටයුතු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවට යොමු කරන ලද වෙනත් යම් කාරණයක්.

සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම කොමිෂන් සභාවේ කාර්යය වන්නේය".

154ජ (5) අනුව්‍යවස්ථාව: "රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීමේ අරමුණින් කොමිෂන් සභාව විසින් ඒ ප්‍රතිපත්ති පිළියෙල කළ යුතු අතර ඒ අනුව,

අ) එක් එක් පළාතේ ජන සංඛ්‍යාව;

ආ) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම;

ඇ) විවිධ පළාත් අතර සමාජ හා ආර්ථික විෂමතා අනුක්‍රමිකව අඩු කිරීමේ අවශ්‍යතාවය; හා

ඈ) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම සහ පළාත් අතර ඉහළම ඒක පුද්ගල ආදායම අතර වෙනස අනුක්‍රමිකව අඩු කිරීමේ අවශ්‍යතාවය

සැලකිල්ලට ගත යුත්තේය."

මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ ලැබීමෙන් පසු, ගරු ජනාධිපතිතුමා විසින් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබයි. අනතුරුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (7) අනුව්‍යවස්ථාව අනුව ගරු ජනාධිපතිතුමා විසින් එකී නිර්දේශ හා එම නිර්දේශ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ.

### 1.4 මුදල් කොමිෂන් සභාව විසින් ඉටු කරනු ලබන කාර්යයන්

ඉහත 1.3 හි සඳහන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන අනුව මුදල් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යය වනුයේ, පළාත් අවශ්‍යතා සපුරාලීම සඳහා වාර්ෂිකව ජාතික අයවැයෙන් ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීම සහ රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීම පිණිස එම අරමුදල් පළාත් නවය අතර බෙදා හැරීමට අදාළ ප්‍රතිපත්ති පිළිබඳව නිර්දේශ රජය වෙත ඉදිරිපත් කිරීමයි. මෙම ක්‍රියාවලියේදී මුදල් කොමිෂන් සභාව විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලැබේ.

i. පළාත් සභාවන්හි වාර්ෂිකව සම්පත් අවශ්‍යතා ඇස්තමේන්තු සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා පළාත් සභා වෙත මාර්ගෝපදේශ සැපයීම.

ii. පළාත් බලධාරීන් සමඟ පවත්වනු ලබන සවිස්තරාත්මක සාකච්ඡා වට ගණනාවකින් අනතුරුව පළාත් සභාවල අවශ්‍යතා තක්සේරු කිරීම.

iii. ජාතික අයවැයෙන් පළාත් සභාවලට අවශ්‍ය අරමුදල් වෙන් කිරීම සම්බන්ධයෙන් සහ එම අරමුදල් පළාත් අතර බෙදා වෙන් කිරීම සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

iv. ගරු ජනාධිපතිතුමාගේ/ආණ්ඩුවේ අනුමැතිය ලැබීමෙන් පසු ජාතික අයවැය මගින් වෙන් කරන ලද අරමුදල් පළාත් සභාවන්හි විවිධ අංශ අතර බෙදා හැරීම.

v. අරමුදල් භාවිතයේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සැකසීමට අදාළ මාර්ගෝපදේශ නිකුත් කිරීම.

vi. අදාළ පාර්ශ්වකරුවන් සමඟ එක්ව පළාත් සංවර්ධන සැලසුම් සමාලෝචනය කර ඒ සඳහා එකඟතාව ලබා දීම.

vii. සංවර්ධන මැදිහත්වීම් සඳහා ජාතික මට්ටමත්, පළාත් මට්ටමත් අතර ආංශික සම්බන්ධීකරණය ප්‍රවර්ධනය කිරීම.

viii. පළාත් සේවක සංඛ්‍යාව කළමනාකරණය සම්බන්ධයෙන් රජයට නිර්දේශ සැපයීම.

## 1.5 නිර්දේශ ඉදිරිපත් කිරීම

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සහ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ පළාත් බලධාරීන් සමඟ එක්ව පවත්වනු ලබන සවිස්තරාත්මක උපදේශන රැස්වීම් මාලාවකින් පසුව මුදල් කොමිෂන් සභාව විසින් ඒ ඒ පළාතේ සම්පත් අවශ්‍යතාවය පිළිබඳ සිය නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.

එම නිර්දේශ ඉදිරිපත් කිරීමේදී මුදල් කොමිෂන් සභාව විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ප්‍රතිපාදන, ජාතික ප්‍රතිපත්ති මාර්ගෝපදේශ, අදාළ කැබිනට් තීරණ, තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs), පළාත් බලධාරීන් සමඟ සාකච්ඡා කිරීමෙන් හඳුනාගත් ඉක්මනින් විසඳුම් ලබාදිය යුතු ගැටලු, පළාත්වල සමාජ-ආර්ථික තත්ත්වය සහ පළාත් මධ්‍ය කාලීන සංවර්ධන සැලැසුම්වල හඳුනාගෙන ඇති සංවර්ධන ප්‍රමුඛතා යන කරුණු සැලකිල්ලට ගනු ලැබේ.

පළාත් සභා විසින් ඉල්ලා සිටිනු ලබන පුනරාවර්තන වියදම් අවශ්‍යතා (එක් එක් අංශවල නඩත්තු වියදම් ඇතුළුව) නිර්දේශ කිරීමේදී, රජය විසින් මුහුණ දෙන දැඩි අයවැය දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් අත්‍යවශ්‍ය සේවා සැපයීම සඳහා අවශ්‍ය අවම සම්පත් ප්‍රමාණය සැලකිල්ලට ගනු ලැබූ අතර, ප්‍රාග්ධන අරමුදල් නිර්දේශය, දැඩි ලෙස දැනෙන ආයෝජන අවශ්‍යතා සඳහා පමණක් සීමා කරන ලදී.

ඒ අනුව, වාර්තාවේ 2 පරිච්ඡේදය තුළ, පළාත් සභා සඳහා වෙන් කර ඇති අරමුදල් වර්ගවලට අදාළ මූලික තොරතුරු ඇතුළත් වේ.

පළාත් සභාවල මූල්‍ය අවශ්‍යතා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සහ ක්‍රමවේදය 3 වන පරිච්ඡේදයේ විස්තර කර ඇත. තවද, 154ජ (4) අනුව්‍යවස්ථාවට අනුකූලව රජයේ ප්‍රදාන පළාත් සභා අතර බෙදා හැරීම නිර්දේශ කිරීම සම්බන්ධයෙන් වන තොරතුරු ද එහි ඇතුළත්ව ඇත.

පෙර නොවූ විරූ මූල්‍ය අර්බුදයකට රජය මුහුණ දී ඇති පසුබිමක, ජාතික මෙන්ම පළාත් මට්ටමින් සම්පත් වෙන්කිරීමේ හා භාවිතයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම අරමුණු කරගත් ඇතැම් යෝජනා ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාව අපේක්ෂා කරන අතර, එම යෝජනා මෙම වාර්තාවේ 4 වැනි පරිච්ඡේදයේ දක්වා ඇත. අතීතයේදී ඉදිරිපත් කරන ලද සිය නිර්දේශවලින් වැඩි ප්‍රමාණයක් (අතිරේක වියදමකින් තොරව ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ පවා ) ක්‍රියාවට නංවා නොමැති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇති බැවින්, එසේ කලින් කරන ලද වැදගත් නිර්දේශ කිහිපයක් ද එම පරිච්ඡේදයේ නැවත අවධාරණය කර ඇත.

## 2 වන පරිච්ඡේදය

## පළාත් සභා සඳහා සම්පත් වෙන් කිරීම

### 2.1 පාලනයේ ස්ථර ත්‍රිත්වය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන හා නියමයන්ට අනුව, ශ්‍රී ලංකාව තුළ (මධ්‍යම) රජය, පළාත් සභා සහ පළාත් පාලන ආයතන ලෙස සුවිශේෂී පාලන තල තුනක් පිහිටුවා ඇති අතර, ඒවා එකිනෙකක් විසින් ක්‍රියාත්මක කළ යුතු ව්‍යවස්ථාදායක සහ විධායක බලතල සහ කාර්යභාරයන් ද වෙන් කොට දක්වා ඇත. තුන්වන මට්ටමේ පාලන තන්ත්‍රය (පළාත් පාලන ආයතන) පළාත් සභා වෙත පවරන ලද විෂයයක් ලෙස දක්වා ඇත. පළාත් සභා වෙත පවරන ලද විෂයන් හා කාර්යභාරයන් දැක්වෙන පළාත් සභා ලැයිස්තුව I වන ලැයිස්තුව ලෙසත්, (මධ්‍යම) රජය සතු බලතල දැක්වෙන සංවෘත ලැයිස්තුව II වන ලැයිස්තුව ලෙසත් රජය හා පළාත් සභා හවුලේ දරන වගකීම් සඳහන් වන සමගාමී ලැයිස්තුව III වන ලැයිස්තුව ලෙසත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ දක්වා ඇත.

පළාත් මට්ටමින් රාජ්‍ය ආයෝජන සහ සේවා සැපයීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන, පළාත් සභා ප්‍රඥප්ති සහ පළාත් පාලන ආයතනයන්හි අනුනීතිවලට අනුව පිළිවෙළින් (මධ්‍යම ) රජයේ ආයතන පළාත් බලධාරීන් මෙන්ම පළාත් පාලන ආයතන විසින් ද සිදු කරනු ලබයි. පළාත් සභා ලැයිස්තුවේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ වගකීම පළාත් සභා සතු වන අතර, සමගාමී ලැයිස්තුව යටතේ ඇති විෂයන් සම්බන්ධව මධ්‍යම රජය සමඟ වගකීම් බෙදාගෙන කටයුතු කළ යුතුව ඇත.

ජනතාවට රාජ්‍ය සේවා සැපයීම සම්බන්ධයෙන් පළාත් සභාවලට පවරා ඇති විෂයයන් පුළුල් වන අතර ඊට අධ්‍යාපනය, සෞඛ්‍ය, පළාත් පාලන, පළාත් සහ පළාත් පාලන මාර්ග, කෘෂිකර්ම, වාරිමාර්ග, සමාජ සේවා, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාමීය සංවර්ධන සහ ක්‍රීඩා යනාදිය ඇතුළත් වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 09 වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පළාත් සභා ලැයිස්තුවට, පළාත් සභා විසින් එකතු කළ යුතු ආදායම් ප්‍රභවයන් 20 ක් ද ඇතුළත් වේ. කෙසේ වෙතත්, එම ප්‍රභාවයන් මගින් කිසිසේත්ම පළාත් සභාවන්ට බලය පවරන ලද විෂයයන්ට අදාළ වගකීම් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් මට්ටමින් ආදායම් ඉපයීම සිදු නොවේ. එබැවින් මෙම වගකීම් ඉටු කිරීමට ප්‍රමාණවත් අරමුදල් මහා භාණ්ඩාගාරයෙන් පළාත් සභාවලට ලබාදීම අවශ්‍ය වේ.

### 2.2 පළාත් සභාවල වියදම් අවශ්‍යතා සපුරාලීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පළාත් සභාවලට බලය පවරා ඇති මූලාශ්‍රවලින් ලැබෙන ආදායම් ඔවුන්ගේ වියදම් අවශ්‍යතා සපුරාලීමට කිසිසේත් ප්‍රමාණවත් නොවූ බැවින්, ආරම්භයේ සිටම පළාත් සභාවලට වියදම් පියවා ගැනීම වෙනුවෙන් අරමුදල් ලබාදීමට රජයට සිදුවිය. විශේෂයෙන්, 2011 දී ව්‍යාපාර පිරිවැටුම් බද්ද (BTT) හා 2019 වසරේ දී ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) අහෝසි කිරීමෙන් පසුව, දැන් එම තත්වය වඩාත් බැරෑරුම් වී ඇත.

සෞඛ්‍ය හා අධ්‍යාපනය ඇතුළුව බලය පවරන ලද විෂයයන් මෙන්ම සමගාමී ලැයිස්තුවේ විෂයයන් යටතේ සඳහන් සේවා සැපයීමේ දී අවශ්‍ය වන පුනරාවර්තන වියදම් අවශ්‍යතාවලට අමතරව, පළාත් සභා විසින් ඔවුනට ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන හරහා තුලිත ප්‍රාදේශීය සංවර්ධනය ඉලක්ක කර ගනිමින් සංවර්ධන කටයුතු සිදු කිරීම ද අවශ්‍ය වේ. කෙසේ වුවද, ප්‍රාග්ධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබා දෙන අරමුදල් ප්‍රමාණය ඇමුණුම-1 වගුවේ දක්වා ඇති අතර, එය මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇති මුදලට වඩා බෙහෙවින් අඩුය. පසුගිය වසර 05 ගැන සලකා බැලීමේ දී, අයවැය ප්‍රතිපාදනවලින් 62% (හෝ මුදල් කොමිෂන් සභාව නිර්දේශ කළ මුදලින් 26%) ක් පමණක් අක්මුදල් ලෙස පළාත් සභා වෙත ලැබී ඇති අතර, එය කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බව පෙනේ. පළාත් නවයටම ලැබෙන මුළු ප්‍රාග්ධන ප්‍රදාන ප්‍රමාණය රජයේ මුළු ප්‍රාග්ධන වියදමෙන් 3.7% ක් පමණක් වන බව මෙහිදී සඳහන් කිරීම වටී. මෙම

තත්ත්වය මනාව වටහාගත් මීට ඉහත පැවති කොමිෂන් සභාව විසින් ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලද නිර්දේශයන්හි දී මුළු ප්‍රාග්ධන වියදමෙන් අවම වශයෙන් 30% ක් පළාත් සභාවලට ලබාදිය යුතු බවට මතයක් පළකර තිබුණි. සමාන මට්ටමේ බලය බෙදීමක් කර ඇති අනෙකුත් සමහර රටවල් සමඟ සසඳන විට මෙම ප්‍රතිශතය ද අඩු මට්ටමක පවතින බව පෙනේ.

පළාත් සභා සඳහා ලබා දෙනු ලබන අරමුදල් ප්‍රමාණවත් නොවීම හැරුණු විට, මෙම කාරණයට අදාළව තවත් විෂමතා දෙකක් ඇති බව මුදල් කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත. පළමු කරුණ නම්, ඇතැම් බලය පවරන ලද විෂයයන් සඳහා පළාත් සභාවලට ලැබෙන ප්‍රාග්ධන අරමුදල්, එම විෂයයන් සඳහාම ජාතික අයවැයෙන් රේඛීය අමාත්‍යාංශ/රාජ්‍ය අමාත්‍යාංශවලට ලැබෙන ප්‍රමාණයට වඩා බෙහෙවින් අඩු වීමයි. පහත දැක්වෙන වගුවෙන් පැහැදිලි වන දෙවන විෂමතාවය නම්, පළාත් සභාවල ප්‍රාග්ධන වියදම එකී ආයතනවල පුනරාවර්තන වියදම්වල අනුපාතයක් ලෙස ගත් කල්හි, එය සමස්ත රජයේ වියදම්වලට අදාළ එකී අනුපාතයට වඩා බෙහෙවින් අඩු මට්ටමක පැවතීමයි.

**වගුව- 01: 2021 වර්ෂය සඳහා ජාතික සහ පළාත් මට්ටමින් ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් වෙන් කිරීම.**

**රු. බිලියන**

| **වියදම් අයිතමය** | **රජයේ ආයතන** | **පළාත් සභා** | **එකතුව** |
|---|---|---|---|
| **ප්‍රාග්ධන වියදම්** | 1054.51 (30.7%) | 40.50 (11.4 %) | 1095.01 (28.9 %) |
| **පුනරාවර්තන වියදම්** | 2380.15 (69.3%) | 314.00 (88.6 %) | 2694.15 (71.1 %) |
| **එකතුව** | **3434.66 (100%)** | **354.50 (100 %)** | **3789.16 (100 %)** |

මධ්‍යම රජය යටතේ සේවයේ යෙදී සිටින රාජ්‍ය සේවකයින්ට සාපේක්ෂව පළාත් සභාවන්ට අනුයුක්තව අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රවල සේවය කරන රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව ඉහළ අගයක් ගැනීම හේතුවෙන් පළාත් සභාවන්හි පුනරාවර්තන වියදම් ඉහළ මට්ටමක පැවතීම යම් තරමක් දුරට හෝ සාධාරණීකරණය කල හැකි වුවත්, අපේක්ෂිත මට්ටමේ ප්‍රාදේශීය සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමට නම් පළාත් සභාවන්ට අදාළ ප්‍රාග්ධන වියදම් අනුපාතය ද වැඩි කළ යුතුව ඇත.

**2.3 ජාතික අයවැයෙන් පළාත් සභා සඳහා ලබා දීම පිණිස මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ප්‍රදාන වර්ග**

පළාත් සභා වෙත ආකාර හතරකට අරමුදල් ලබාදීමට මුදල් කොමිෂන් සභාව නිර්දේශ කරනු ලැබේ.

අ) සාමූහික ප්‍රදාන: රාජ්‍ය සේවා සැපයීම වැඩිදියුණු කිරීමට හා තිරසාරව පවත්වාගෙන යාම සඳහා වන පළාත් සභාවල පුනරාවර්තන වියදම් අවශ්‍යතා මෙමගින් සපුරාලනු ලබයි. පුනරාවර්තන වියදම්වල ප්‍රධාන සංරචකය වනුයේ අනුමත සේවක සංඛ්‍යාව මත පදනම් වූ පුද්ගල පඩිනඩි වේ. පළාත් සභා සඳහා තක්සේරු කරන ලද පුනරාවර්තන අවශ්‍යතා තුළට, පළාත් පාලන ආයතන වෙත කෙරෙන මාරු කිරීම් සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීම සඳහා වන වියදම් ඇතුළත් වේ. විමධ්‍යගත ආදායම් ප්‍රභවයන් මත එකතු කරනු ලබන ආදායම් ප්‍රමාණය ඉතා කුඩා බැවින්, පුනරාවර්තන වියදම්වල විශාලතම කොටස සාමූහික ප්‍රදාන මගින් සපුරා ගනු ලබයි.

ආ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන: පළාත් සභා වෙත පවරා දී ඇති විෂයයන් යටතේ ඇති විවිධ අංශවල යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ප්‍රාග්ධන ස්වභාවයේ සංවර්ධන වැඩසටහන්

ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ප්‍රදානය වෙන් කෙරේ. මුදල් කොමිෂන් සභාවේ මගපෙන්වීම යටතේ පොදු ඒකාබද්ධ සැලසුම් රාමුවක් තුළ, අදාළ මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්මට අනුකූලව පළාත් සභා විසින් සකස් කරනු ලබන පළාත් වාර්ෂික සැලසුම් ක්‍රියාත්මක කිරීම මෙමගින් සිදු කෙරේ.

ඇ) උපමාන පාදක ප්‍රදාන : මෙය පළාත් සභාවන්හි අභිමතය පරිදි සංවර්ධන ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා (වාර්ෂික සංවර්ධන සැලසුම් තුළ පැවතීම අත්‍යාවශ්‍ය නොවන) ලබා දෙන තවත් ප්‍රදානයකි. මූලික වශයෙන්ම පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා විමධ්‍යගත අයවැය සම්බන්ධව පෙර එකඟ වූ පරිදි අරමුදල් සැලසීමට මෙන්ම පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ආවරණය නොවන පළාත් සභා යටතේ ඇති කුඩා අංශවල සංවර්ධන වැඩසටහන් සඳහා මෙම ප්‍රදානය යොදා ගත හැකි අතර, ඊට අමතරව වැඩසටහන් ක්‍රියාත්මක කරන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනය සහ ධාරිතා සංවර්ධනය සඳහා ද යොදා ගත හැකිය.

ඈ) ආදායම් කාර්යසාධන ප්‍රදාන: මෙය පළාත් සභා විසින් උපයන ආදායම් වැඩි කිරීම සඳහා ඔවුන් දිරිමත් කිරීම වෙනුවෙන් නිර්දේශ කරනු ලබන ප්‍රදානයකි. මෙය සංවර්ධනය ඉලක්ක කරගත් කුඩා ප්‍රදානයක් වන අතර, එය පළාත් සභාවන්ට බලය පවරන ලද ආදායම් එකතු කිරීම්වල වාර්ෂික වර්ධක මත පදනම් වේ. ප්‍රාග්ධන ස්වරූපයේ සංවර්ධන වැඩසටහන් සඳහා තම අභිමතය පරිදි මෙම ප්‍රදානය භාවිතා කිරීමට පළාත් සභාවලට බලය ඇත. සම්පත් සීමිත වීම හේතුවෙන් මෙම සංරචකය සඳහා අරමුදල් සැපයීමට භාණ්ඩාගාරයට නොහැකි වී ඇත.

ඉහත ප්‍රදාන වලට අමතරව, පහත සඳහන් මූලාශ්‍ර හරහා ද පළාත් සභාවලට අරමුදල් ලැබේ;

අ) රේඛීය අමාත්‍යාංශ ඔවුන්ගේ වැඩසටහන්/ ව්‍යාපෘති පළාත් සභා හරහා ක්‍රියාත්මක කිරීමේදී ලැබෙන අරමුදල්.

ආ) සංවර්ධන පාර්ශවකාර (විදේශාධාර සපයන) ආයතන විසින් අරමුදල් සපයනු ලබන විශේෂ ව්‍යාපෘතිවල පළාත් සංරචක ක්‍රියාත්මක කිරීම සඳහා ලබාදෙන ප්‍රතිපාදන.

## 3 වන පරිච්ඡේදය

## 2023 වර්ෂය සඳහා පළාත් සභාවන්හි ප්‍රාග්ධන හා පුනරාවර්තන අවශ්‍යතා තක්සේරුව හා පළාත් සභා අතර ප්‍රදානයන් බෙදා හැරීම සම්බන්ධ නිර්දේශ

### 3.1. පළාත් වියදම් අවශ්‍යතා තක්සේරුවේ දී අවධානය යොමු කරන ලද කරුණු

ජාතික අයවැයෙන් පළාත් සභා සඳහා ලබාදෙන ප්‍රදානයන් නිර්දේශ කිරීම සඳහා අවශ්‍යතා තක්සේරුවේ දී මුදල් කොමිෂන් සභාව විසින් පහත සඳහන් කරුණු සලකා බලන ලදී.

අ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන, ප්‍රතිපත්තිමය රාමුව හා අමාත්‍ය මණ්ඩල තීරණ ආදී අනෙකුත් අදාල කරුණු

ආ. පළාත් මධ්‍යකාලීන සංවර්ධන සැලැස්ම තුළ හඳුනාගන්නා ලදුව පළාත් අධිකාරීන් සමඟ කටයුතු කිරීමේ දී ඉස්මතු වූ ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතාවයන්

ඇ. 2023 වසර සඳහා රජයේ ප්‍රදානයන් ලබාගැනීම වෙනුවෙන් පළාත් සභා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් අවශ්‍යතා

ඈ. මුදල් කොමිෂන් සභාවේ මෑත කාලීන නිර්දේශයන් සම්බන්ධ ගරු ජනාධිපතිතුමාගේ නිරීක්ෂණ හා එකී නිර්දේශයන්ට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණ

ඉ. පළාත්වල සමාජ ආර්ථික තත්ත්වයන්

ඊ. සාධාරණ පරිදි ප්‍රතිලාභ බෙදී යන තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් සඳහා වූ අවශ්‍යතාවයන්

උ. අදහස් ලබාගැනීම සඳහා පාර්ශවකරුවන් සමඟ පැවැත්වූ සාකච්ඡාවන්හි දී මතුවූ කරුණු සහ යම් යම් අධ්‍යයනයන් මගින් සොයාගත් කරුණු

තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් සඳහා ප්‍රමාණවත් පරිදි ප්‍රදානයන් පළාත් සභා වෙත නොලැබෙන බව සැලකිල්ලට ගනිමින් අවම වශයෙන් ඇස්තමේන්තුගත රජයේ සමස්ත ප්‍රාග්ධන ආයෝජනයෙන් 20% ක් වත් පළාත් සභාවලට ලබා දිය යුතු බවට මුදල් කොමිෂන් සභාව විසින් මෑත වසරවල දී නිර්දේශ කරන ලදී. මෙම ප්‍රදානයන් ලබාදීමේ දී රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද ජාතික ප්‍රතිපත්ති මෙන්ම පළාත් සභා සඳහා බලය බෙදා දීමේ රාමුව ද සැලකිල්ලට ගත යුතුය. මීට අමතරව පළාත් සභා හා රේඛීය අමාත්‍යාංශ මගින් විමධ්‍යගත හා සමගාමී විෂයයන් සඳහා මුදල් වෙන් කිරීමේ දී සිදුවෙන ද්විකරණයන් වැළැක්විය යුතු බවටත් පළාත් සභා විශේෂ වියදම් ඒකක ලෙස සලකමින් ප්‍රධාන ලේකම්වරුන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් ලෙස පත් කළ යුතු බවටත් නිර්දේශ කරන ලදී .

### 3.2. පළාත් සභා වියදම් අවශ්‍යතා හා මුදල් කොමිෂන් සභාව විසින් තක්සේරු කරන ලද ප්‍රදානයන්

2023 වර්ෂය සඳහා පුනරාවර්තන හා ප්‍රාග්ධන අවශ්‍යතා වෙන් වෙන්ව හඳුනාගැනීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශයන් 2022.01.28 දින මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සභාවන් වෙත නිකුත් කරන ලදී. මෙම මාර්ගෝපදේශ මත පදනම්ව ජාතික අයවැයෙන් ප්‍රදානයන් වෙන් කරවා ගැනීම සඳහා, පළාත් සභාවන් විසින් සිය වාර්ෂික පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා සකස් කොට ඇත.

රජයේ සංවර්ධන උපාය මාර්ග හා තිරසාර සංවර්ධන අභිමතාර්ථයන්ට අනුගත වෙමින් හා පළාතට සුවිශේෂී වූ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් පළාත් සභා විසින් පිළියෙල කොට ඇති ඔවුන්ගේ විස්තරාත්මක මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්ම පළාත් සම්පත් අවශ්‍යතා තක්සේරුවට මූලික වශයෙන් පදනම් කරගන්නා ලදී. මධ්‍ය කාලීන ක්‍රියාකාරී සැලැස්ම සඳහා වියදම් අවශ්‍යතා හඳුනා ගැනීමේ දී විවිධ අරමුදල් ප්‍රභවයන්ගෙන් මූල්‍යනය කිරීම සඳහා සකස් කරන ලද මධ්‍ය කාලීන සැලැස්ම තුළ අන්තර්ගත ඉලක්කයන් හා කාලරාමුව සැලකිල්ලට ගන්නා ලදී. ඒ අනුව, යම් වර්ෂයක් සඳහා පළාත් සභාවන්හි ප්‍රාග්ධන වියදම් අවශ්‍යතාවය සකස් කරනු ලබන්නේ ජාතික අයවැයෙන් වෙන් කෙරෙන පළාත් නිශ්චිත ප්‍රදානයන් මගින් පළාත් සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට හැකි වන අයුරිනි.

ආයතනික හා මෙහෙයුම් සැලසුම්, අනුමත කාර්ය මණ්ඩලය, වත්කම් නඩත්තුව, පළාත් පාලන ආයතන හා සංස්ථාපිත ආයතන සඳහා මාරු කිරීම් හා අනෙකුත් පුනරාවර්තන ස්වරූපයේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනිමින් සම්මත ආකෘතියකට අනුව පළාත් සභාව විසින් සිය පුනරාවර්තන වියදම් අවශ්‍යතා හඳුනාගනු ලැබේ.

පළාත් බලධාරීන්ගේ හා අදාල ජාතික මට්ටමේ අධිකාරීන්ගේ ද අදහස් සැලකිල්ලට ගනිමින් මුදල් කොමිෂන් සභාව විසින් එක් එක් පළාත් සභාව සඳහා වියදම් අවශ්‍යතා සමාලෝචනය කිරීම හා අවසන් අගයන් තීරණය කිරීම සිදු කරනු ලබයි.

ඒ සමඟ ම පළාත් සභා වෙත බලය පැවරුණු ආදායම් ප්‍රභවයන්ගෙන් අපේක්ෂිත ආදායම ඇස්තමේන්තු කිරීම හා සමාලෝචනය ද සිදු කරන ලදී. සම්ප්‍රදායක් වශයෙන්ම පළාත් සභාවන්හි පුනරාවර්තන වියදම් සඳහා වන ප්‍රදානයන් (සාමූහික ප්‍රදාන) අවසාන වශයෙන් තීරණය කරනු ලබන්නේ තක්සේරු කරන ලද මුළු පුනරාවර්තන වියදමෙන් තක්සේරු කරන ලද ආදායම හා රජය විසින් සිදු කරන ආදායම් මාරු කිරීම් අඩු කිරීම මඟිනි.

සේවා සැපයුම හා සංවර්ධන ක්‍රියාවලීන් සඳහා පළාත් සභාවන්ට පහත අයුරින් ප්‍රදානයන් ලැබේ. (කරුණාකර 2.3 ඡේදය බලනු මැනවි.)

අ. ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා වන ජාතික අයවැය ප්‍රදානයන්ගෙන් වැඩි ප්‍රමාණයක් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානයන් ලෙසත් කුඩා ප්‍රමාණයක් උපමාන පාදක ප්‍රදාන ලෙසත් නිර්දේශ කෙරේ (ආදායම් කාර්යසාධන ප්‍රදාන මගින් නිර්දේශ කරනු ලබන කුඩා ප්‍රමාණයක් ද ප්‍රාග්ධන ක්‍රියාකාරකම් සඳහා යොදාගත හැක).

ආ. පළාත් සභා පුනරාවර්තන වියදම් අවශ්‍යතා සඳහා වූ අරමුදල් අවශ්‍යතාවයන් සාමූහික ප්‍රදාන යටතේ ලැබේ.

ඇ. රේඛීය අමාත්‍යාංශවල ව්‍යාපෘතීන් හා වැඩසටහන් පළාත් සභා මගින් ක්‍රියාත්මක කිරීමේ දී ලබාදෙන අරමුදල්

ඈ. සංවර්ධන පාර්ශවකාර ආයතන විසින් මූල්‍යනය කෙරෙන (විදේශ ආධාර) විශේෂ ව්‍යාපෘතිවල පළාත් සංරචකය ක්‍රියාත්මක කිරීමේ දී ලබාදෙන ප්‍රතිපාදන

පළාත් සභා විසින් මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අවශ්‍යතාවයන්, මුදල් කොමිෂන් සභාව විසින් ඉහත (අ) හා (ආ) යටතේ වූ ප්‍රදානයන් ලබාදීම සඳහා තක්සේරු කරන ලදී.

### 3.3 රජයේ ප්‍රදාන සඳහා පළාත් සභා වියදම් අවශ්‍යතා තක්සේරු කිරීම

#### 3.3.1 පළාත් සභා සඳහා ප්‍රාග්ධන ප්‍රදාන තක්සේරුව

මුදල් කොමිෂන් සභාව විසින් ලබාදෙන ලද ආකෘති පත්‍රයන්ට අනුව පළාත් සභා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු පදනම් කරගෙන පළාත් සභාවන්හි ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරුව සිදු කරන ලදී. පළාත් සභා සඳහා පළාත් නිශ්චිත සංවර්ධන අරමුදල් යටතේ මුදල් වෙන් කිරීම පොදුවේ පහත සඳහන් අංශ යටතේ සිදු කෙරේ. නිසි සාධාරණීකරණයන් සහිතව ඒ ඒ පළාත්වල නිශ්චිත අවශ්‍යතා අනුව තවත් අතිරේක අංශයන් ද ඇතුළත් කළ හැකිය.

* අධ්‍යාපනය
* බටහිර වෛද්‍ය
* දේශීය වෛද්‍ය
* පළාත් මාර්ග
* ඉඩම් සංවර්ධනය
* වාරිමාර්ග
* කෘෂිකර්ම
* පශු සම්පත්
* ප්‍රවාහන
* නිවාස
* ග්‍රාමීය විදුලි සැපයුම්
* මිරිදිය ධීවර කටයුතු
* කුඩා කර්මාන්ත
* ක්‍රීඩා
* පරිවාස හා ළමාරක්ෂක
* සමාජ සේවා
* සංස්කෘතික හා ආගමික කටයුතු
* සමුපකාර සංවර්ධනය
* මුල් ළමාවිය සංවර්ධනය
* වතු යටිතල පහසුකම්
* පළාත් පාලනය
* සංචාරක ව්‍යාපාරය
* ග්‍රාමීය සංවර්ධනය

විවිධ අංශයන් අතර ප්‍රතිපාදන වෙන් කිරීමේ දී ඉහත අංශයන්ට අමතරව, ඉහත අංශයන්හි ඌනතා පියවා ගැනීම සඳහා නම්‍යශීලී අරමුදලක් මෙන්ම විශේෂ අවශ්‍යතා සහිත ගම්මානයන් සංවර්ධනය කිරීම සඳහා ප්‍රදානයන් ද ලබා දෙනු ලැබේ.

### 3.3.2 2023 සඳහා ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා තක්සේරුව

පළාත් ආංශික ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා මූලික වශයෙන් හඳුනාගනු ලැබුවේ ආණ්ඩුකාරවරුන්, ප්‍රධාන ලේකම්වරුන් සහ අනෙකුත් පළාත් බලධාරීන්ගේ සහයෝගය ද ඇතිව එක් එක් අංශයන්හි තාක්ෂණික විශේෂඥතාවය ලත් පුද්ගලයන්ගෙන් ද සමන්විත පළාතේ ඒ ඒ ආයතන විසිනි. ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරුව මුදල් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ මත පදනම්ව සිදු කරනු ලබයි. තවද, පළාත් පස් අවුරුදු සංවර්ධන සැලසුම්/මධ්‍ය කාලීන ආංශික ප්‍රතිඵල රාමුව, තිරසාර සංවර්ධන අභිමතාර්ථ, පළාත් තුළ හා පළාත් අතර පවත්නා විෂමතා, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හැකියාව සහ ඒවායේ ශක්‍යතා රේඛීය අමාත්‍යාංශ විසින් ක්‍රියාත්මක කරන පළාත් මට්ටමේ විශේෂ සංවර්ධන වැඩසටහන් හා පළාත්වල භෞතික හා මානව සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි ද අවධානය යොමු කොට ඇත.

බලය පවරන ලද අංශවලට අදාල සේවාවන් සැපයීම සඳහා සිදු කරන ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරුවේ දී අවිච්ඡේද ව්‍යාපෘතීන්, භෞතික යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය, ආයතනික හා ප්‍රතිලාභී ධාරිතා සංවර්ධනය ආදී තීරණාත්මක සංවර්ධන අවශ්‍යතා සැලකිල්ලට ගන්නා ලදී. කෙසේවෙතත්, වර්තමානයේ රජය විසින් දැඩි අයවැය හිඟයකට මුහුණ පා සිටියද සිය ආයතනයට පැවරී ඇති ව්‍යවස්ථානුකූල වගකීම සැලකිල්ලට ගනිමින් (වෙනත් සීමාවන් සැලකිල්ලට නොගනිමින්) මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සභාවලට බලය පවරන ලද විෂයන් යටතේ සිදුකරන ඵලදායී සේවා සැපයුමක් සඳහා අවශ්‍ය ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා තක්සේරු කරන ලදී. පළාත් සභා වෙත පවරන ලද විෂයන් සඳහා රේඛීය අමාත්‍යාංශ වෙත ප්‍රතිපාදන වෙන් කිරීමෙන් වැළකී සිටියහොත් රජයට අමතර වැයක් නොවන පරිදි නිර්දේශිත ප්‍රතිපාදන පළාත් සභා වෙත ලබාදිය හැකි බව මුදල් කොමිෂන් සභාවේ අදහසයි.

මේ අනුව, 2023 වර්ෂය සඳහා පළාත් සභා සඳහා තක්සේරු කරන ලද ප්‍රාග්ධන අරමුදල් අවශ්‍යතාවය රුපියල් බිලියන 167 ක් වේ. එහි පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන රුපියල් බිලියන 149 ක් උපමාන පාදක ප්‍රදාන රුපියල් බිලියන 15ක්

හා ආදායම් කාර්යය සාධන ප්‍රදාන රුපියල් බිලියන 3 ක් අන්තර්ගත වේ. මෙම මුදල් ප්‍රතිපාදනය පළාත් 9 තුළ බෙදා දීම සඳහා වන නිර්දේශය 3.5.1 ඡේදය යටතේ දක්වා ඇත.

### 3.3.3 2023 සඳහා සාමූහික ප්‍රදානය තක්සේරු කිරීම

මුදල් කොමිෂන් සභාව විසින් 2022.01.28 වැනි දින නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුව පළාත් විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් විමර්ශනය කිරීමෙන් පසු පළාත් නිලධාරීන් සමඟ අයවැය සාකච්ඡා පැවැත්වීමෙන් අනතුරුව පළාත්වල පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කරන ලදී.

2023 සඳහා පුනරාවර්තන අරමුදල් අවශ්‍යතා තක්සේරුව පහත සඳහන් කරුණු මත පදනම් වේ;

1. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2022.03.31 දිනට අනුමත කරන ලද මුළු පළාත් සේවක සංඛ්‍යාව

2. ප්‍රධාන වශයෙන්ම සෞඛ්‍ය, දේශීය වෛද්‍ය හා අධ්‍යාපන ආදී රේඛීය අමාත්‍යාංශ විසින් පළාත් සභාවලට මේ වන විටත් අනුයුක්ත කර ඇති නිලධාරීන් සඳහා වූ තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රමාදයන් නිසා ගත් විකල්ප ක්‍රියාමාර්ග සැලකිල්ලට ගෙන ඇත.

3. තේරී පත්වන පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ දීමනා සහ ඔවුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා ජනාධිපති කාර්යාලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛවලට අදාලව ඇස්තමේන්තුගත ප්‍රතිපාදන

4. රජය විසින් කලින් කලට නිකුත් කරන චක්‍රලේඛ, ක්‍රියා පටිපාටි සහ උපදෙස්

5. අනුමත හිඟ වැටුප් සඳහා ප්‍රතිපාදන

6. රජයේ ප්‍රමුඛතා වැඩසටහන යටතේ බඳවාගෙන පළාත් සභාවලට අනුයුක්ත කර ඇති 2021 දී සිය තනතුරුවල ස්ථිර කිරීමට නියමිතව සිටි හා එසේ ස්ථිර නොවූ එහෙත් 2022 දී ස්ථිර කිරීමට නියමිත උපාධිධාරීන්ට ගෙවිය යුතු වැටුප් හා වේතන සඳහා ප්‍රතිපාදන ඇතුළත් කර ඇත.

7. පාසල් 1000 සංවර්ධන වැඩසටහන යටතේ ජාතික පාසල් ලෙස උසස් කරන ලද පළාත් සභා පාසල්වල කාර්යය මණ්ඩලය සඳහා 2024 දක්වා වැටුප් අවශ්‍යතාව (2024 දක්වා මෙම කාර්ය මණ්ඩලයට පළාත් අරමුදල් යටතේ වැටුප් ගෙවීමට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කරන ලද ඉල්ලීමට එකඟවී ඇත.)

8. අතිකාල හා නිවාඩු දින වැටුප් සඳහා පළාත් ඉල්ලීම් පෙර වසරවලට වඩා සාපේක්ෂව විශාල ලෙස වැඩි වී ඇත. දැනට සේවයේ යෙදෙන කාර්ය මණ්ඩලය හා මෑත කාලීන සත්‍ය වියදම් රටාව සැලකිල්ලට ගනිමින් 2023 අවශ්‍යතාව තක්සේරු කර ඇත.

9. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, පළාත් සහා සමඟ අයවැය රැස්වීම්වල දී එකඟතාවය පළ කරන ලද පරිදි පළාත් පාලන මන්ත්‍රීවරුන්ගේ දීමනා හා පළාත් පාලන කාර්ය මණ්ඩල සඳහා වැටුප් ප්‍රතිපූරණ ලෙස පළාත් පාලන මාරු කිරීම් රුපියල් 35,538,779,000 වේ. මෙතෙක් "වෙනත් පුනරාවර්තන වියදම්" ලෙස දක්වන ලද එකී වියදම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව පළාත් සභාවන් සමඟ පවත්වන ලද අයවැය

රැස්වීම්වලදී එකඟ වූ පරිදි හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි මෙවර ''පුද්ගල පඩිනඩි'' යටතේ දක්වා ඇත.

10. 25/04/2018 කොමිෂන් සභා තීරණය අනුව ආයතන වෙත පැවරී ඇති වගකීම් හා ඉටු කරන කාර්යන්ගේ වැදගත්කම සලකා බැලීමෙන් පසුව පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය හා පූර්ව ළමාවිය සංවර්ධන අධිකාරිය යන සංස්ථාපිත ආයතන තුන සඳහා පමණක් පළාත් සභා වෙත වැටුප් සඳහා ප්‍රතිපාදන සපයනු ලබයි.

11. ප්‍රධාන වශයෙන් අධ්‍යාපනය, සෞඛ්‍ය, වාරිමාර්ග, කෘෂිකර්ම හා අනෙකුත් ක්ෂේත්‍රවල මාර්ග, ගොඩනැගිලි හා ව්‍යුහයන්, යන්ත්‍රෝපකරණ හා උපකරණ නඩත්තු ඇතුළු පළාත් වත්කම් නඩත්තුව, ප්‍රතිසංස්කරණය හා නවීකරණය සඳහා අත්‍යවශ්‍ය හා තීරණාත්මක අවශ්‍යතා.

12. ළමා නිවාස හා වැඩිහිටි නිවාස සඳහාත් පිළිකා, වකුගඩු සහ ක්ෂය රෝගීන් වැනි අය සඳහාත් ලබා දෙන ප්‍රතිපාදනයන් අනෙකුත් පුනරාවර්තන වියදම්වලට ඇතුළත්ය.

13. පළාත් ආදායමට අදාල රජයේ ඇතැම් තීරණ සහ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පළාත් ආදායම අඩුවීම (පළාත් විසින් රැස් කරන ආදායමට හා භාණ්ඩාගාරය විසින් පළාත් සභාවන්ට කෙරෙන ආදායම් මාරු කිරීම්වලට සමාන ප්‍රමාණයකින් පුනරාවර්තන ප්‍රතිපාදන අඩු කිරීම මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපත්තියක් වශයෙන් සිදුකරනු ලබයි ).

ඒ අනුව, 2023 වර්ෂයට අදාලව පළාත් සභාවන් සඳහා තක්සේරු කරන ලද පුනරාවර්තන අවශ්‍යතාවය රු. මිලියන 470,083.63 කි.

වගුව 02 : පළාත් සභාවන් සඳහා තක්සේරු කරන ලද පුනරාවර්තන ප්‍රදාන අවශ්‍යතාවය - 2023

(Rs.000)

| පළාත | 31.03.2022 දිනට අනුමත සේවක සංඛ්‍යාව | තක්සේරු කරන ලද පුනරාවර්තන වියදම | | | | අත්තිකාරම් බී ගිණුම් සඳහා ඉල්ලීම් | පුනරාවර්තන වියදම් එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | | පුද්ගල පඩිනඩි | වෙනත් පුනරාවර්තන වියදම් | අවිනිශ්චිත වියදම් ඉල්ලීම් | තක්සේරු කරන ලද මුළු පුනරාවර්තන වියදම් | | |
| '(1) | '(2) | '(3) | '(4) | '(5) | '(6) = (3+4+5) | '(7) | '(8) = (6+7) |
| බස්නාහිර | 62,569 | 61,247,573 | 24,106,977 | 200,000 | 85,554,551 | 3,654,450 | 89,209,001 |
| මධ්‍යම | 48,256 | 43,773,433 | 9,972,195 | 586,555 | 54,332,183 | 1,500,000 | 55,832,183 |
| දකුණු | 46,835 | 44,316,698 | 10,330,809 | 207,600 | 54,855,107 | 4,719,000 | 59,574,107 |
| උතුරු | 31,575 | 32,496,733 | 8,277,472 | 36,664 | 40,810,869 | 650,000 | 41,460,869 |
| වයඹ | 47,818 | 43,492,472 | 8,363,618 | 1,500,000 | 53,356,090 | 2,837,000 | 56,193,090 |
| උතුරු මැද | 29,235 | 26,055,742 | 6,908,107 | 130,000 | 33,093,849 | 1,191,934 | 34,285,783 |
| ඌව | 32,565 | 29,462,285 | 6,642,995 | 55,000 | 36,160,280 | 700,000 | 36,860,280 |
| සබරගමුව | 38,711 | 40,507,978 | 8,081,043 | 400,000 | 48,989,021 | 2,334,350 | 51,323,371 |
| නැගෙනහිර | 37,912 | 36,679,514 | 7,715,435 | 200,000 | 44,594,950 | 750,000 | 45,344,950 |
| එකතුව | **375,476** | **358,032,429** | **90,398,651** | **3,315,819** | **451,746,899** | **18,336,734** | **470,083,633** |

***සටහන: තීරුව 3– සේවයේ නියුතු පුද්ගලයන්, පුරප්පාඩු හා රේඛීය අමාත්‍යාංශ විසින් කෙරෙන අනුයුක්ත කිරීම් සඳහා වන පුද්ගල පඩිනඩි හා හිඟ වැටුප් ඇතුලත්වේ.***

***තීරුව 4 - පළාත් පාලන ආයතන සඳහා මාරු කිරීම්, සංස්ථාපිත පළාත් අධිකාරි සඳහා පුද්ගල පඩිනඩි ඇතුළත්වේ.***
***( පළාත් පාලන ආයතන වලට ලබාදෙන මුද්දර ගාස්තු හා උසාවි දඩ සැලකිල්ලට ගෙන නැත)***

### 3.4 පළාත් ආදායම්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය යටතේ පළාත් සභාවලට බලය පවරා ඇති ආදායම් මූලාශ්‍ර නවවැනි උපලේඛනයේ 1 ලැයිස්තුවේ 36.1 සිට 36.20 දක්වා අයිතමවල අඩංගු වේ.

මෝටර් වාහන ආදායම් බලපත්‍ර ගාස්තු, මත්පැන් අලෙවියට අදාල බලපත්‍ර ගාස්තු, මුද්දර ගාස්තු, උසාවි දඩ සහ ව්‍යාපාර පිරිවැටුම් බද්ද (BTT) පළාත් සභාවල ප්‍රධාන ආදායම් මාර්ග විය. මෙම මූලාශ්‍රවලින් මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් නීත්‍යානුකූලව පළාත් පාලන ආයතන වෙත පැවරිය යුතුය.

තොග සහ සිල්ලර විකුණුම් බදු සඳහා වඩාත්ම වැදගත් ව්‍යාපාර පිරිවැටුම් බද්ද 2011 ජනවාරි 01 වන දින සිට අංක 01/2010 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය මගින් අහෝසි කරන ලදී. පිරිවැටුම් බද්ද අහෝසි කිරීමත් සමඟ පළාත් ආදායමේ බදු පදනම පටු වී ඇත. පළාත් සභා වෙත පවරන ලද ආදායම් මූලාශ්‍රයන්ට අදාලව එහෙත් රජය විසින් එකතු කරනු ලබන ආදායමෙන් පළාත් සභා වෙත මාරු කරන කොටස හා ජාතිය ගොඩනැගීමේ බද්දෙන් පළාත් සභා වෙත ලබා දෙන කොටස වර්තමානයේ දී පළාත් සභාවල ආදායමේ වැදගත් අංගයක් වී ඇත.

ඉහත සඳහන් කළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය හරහා මෙම පැවරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක විය. ඒ අනුව මුද්දර ගාස්තුවෙන් 100% ක්, වාහන ලියාපදිංචි ගාස්තුවෙන් 70% ක් සහ ජාතිය ගොඩනැගීමේ බද්දෙන් (NBT) 33 1/3%ක් පළාත් සභා වෙත මාරු කළ යුතුය. කෙසේ වෙතත්, ජාතිය ගොඩනැගීමේ බද්ද 2019.12.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අහෝසි කරන ලදී.

ඉහත පැවරුම් යාන්ත්‍රණය හඳුන්වාදීම අනුව ආදායමේ කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණද, 2019 වසරේ ජාතිය ගොඩනැගීමේ බද්ද අහෝසි කිරීමත් සමඟ පහත වගුවේ දැක්වෙන පරිදි පළාත් වියදමේ ප්‍රතිශතයන් ලෙස බලන කල්හි පළාත් ආදායමේ සැලකිය යුතු අඩු වීමක් සිදුවී ඇත.

**වගුව 03: පළාත් ආදායම් හා වියදම් (රු. මිලියන)**

| වර්ෂය | මුළු වියදම | මහා භාණ්ඩාගාරයෙන් කෙරෙන මාරුකිරීම් ඇතුලත්ව මුළු ආදායම | සමස්ත පළාත් ආදායම පළාත් වියදමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| **2008** | 120,195 | 30,561 | **25** |
| **2009** | 133,175 | 29,333 | **22** |
| **2010** | 143,491 | 36,506 | **25** |
| **2011** | 149,750 | 46,505 | **31** |
| **2018** | 281,543 | 46,354 | **33** |
| **2019** | 303,740 | 44,235 | **30** |
| **2020** | 335,418 | 41,005 | **16** |
| **2021** | 342,023 | 53,004 | **19** |

පළාත් ආදායමේ ප්‍රතිශතයක් ලෙස පළාත් සභා ආදායම් අඩුවීමත් සමඟ ම පළාත් සභා වෙත රජය විසින් ලබාදෙන ප්‍රතිපාදන වැඩි කිරීමට සිදු වනු ඇත.

### 3.5. රජයේ ප්‍රදාන පළාත් සභා අතර බෙදා වෙන් කිරීම පිළිබඳ නිර්දේශ

### 3.5.1. ප්‍රාග්ධන ප්‍රදාන පළාත් අතර බෙදා වෙන් කිරීම සඳහා නිර්දේශ

පළාත් අතර දක්නට ලැබෙන සමාජ හා ආර්ථික විෂමතා තුනී කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් මෙම පරිච්ඡේදයේ 3.1 සඳහන් නිර්ණායකයන් මත පදනම්ව අවශ්‍යතා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය අනුගමනය කොට පළාත් සඳහා අරමුදල් නිර්දේශ කිරීම මෙන්ම රජයෙන් ලැබෙන ප්‍රදාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (4) (අ) ව්‍යවස්ථානු ප්‍රකාරව පළාත් අතර බෙදීම පිළිබඳව ද කොමිෂන් සභාව විසින් නිර්දේශ ඉදිරිපත් කළ යුතුව ඇත. මෙම ක්‍රියාවලිය පහසු කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමඟ එක්ව පළාත් අතර ප්‍රාග්ධන අරමුදල් වඩාත් අර්ථාන්විත අන්දමින් බෙදා දීම සඳහා සාධක විශ්ලේෂණය නම් වූ බහු විචල්‍ය සංඛ්‍යාන ක්‍රමවේදයක් යොදා ගනිමින් පහත සඳහන් විචල්‍යයන් යොදා ගෙන සංඛ්‍යානමය සූත්‍රයක් සකස් කරන ලදී.

- මධ්‍ය වාර්ෂික ජනසංඛ්‍යාව
- පළාත්වල භූමි ප්‍රමාණය
- පළාතේ දළ දේශීය නිෂ්පාදිතය
- පළාත තුළ සිටින දිළිඳු ජන සංඛ්‍යාව
- පළාතේ මධ්‍යන්‍යය ඒකපුද්ගල ආදායම
- පළාත තුළ එක් වෛද්‍යවරයකු සඳහා සිටින පුද්ගලයන් සංඛ්‍යාව
- පළාත තුළ විද්‍යා විෂය ධාරාවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන සිසුන්ගේ ප්‍රතිශතය.

ඉහත විචල්‍යයන්ට අදාල පළාත් දත්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහා බැංකුව හා විභාග දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගන්නා ලදී.

04 වන වගුව මගින් පළාත්වල තෝරාගත් සමාජ-ආර්ථික දර්ශක පිළිබද නවතම දත්ත ඉදිරිපත් කර ඇත. සාපේක්ෂව පසුගාමී පළාත් අතර රජයේ ප්‍රදානයන් සාධාරණ ලෙස බෙදා හැරීම අරමුණු කර ගනිමින් මුදල් කොමිෂන් සභාව විසින් සෑම පළාතකටම අදාල සමාජ ආර්ථික තත්ත්වයන් සැලකිල්ලට ගනු ලැබීය.

**වගුව 04: පළාත් සඳහා තෝරාගත් භෞතික, ජනසංඛ්‍යා හා සමාජ ආර්ථික දර්ශක**

| පළාත | භූමි ප්‍රමාණය (වර්ග කි.මී.) 2019 | මධ්‍ය වාර්ෂික ජනසංඛ්‍යාව 2019 (000) | පළාත් දළ දේශීය නිෂ්පාදිතය 2019 (රු.බි.) | මධ්‍යනාසය මාසික ඒක පුද්ගල ආදායම 2019 (කුටුම්භයක වශයෙන්) | දරිද්‍ර පුද්ගලයන් සංඛ්‍යාව 2019 | විද්‍යා විෂය ධාරාවෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබූ සමස්ත සිසුන්ගේ ප්‍රතිශතය - 2020 | වෛද්‍යවරයකු සඳහා සිටින පුද්ගලයින් ගණන -2019 |
|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 3,684 | 6,165 | 5694 | 35,171 | 342,200 | 29.1 | 768 |
| මධ්‍යම | 5,674 | 2,781 | 1692 | 25,067 | 503,500 | 10.8 | 1080 |
| දකුණු | 5,544 | 2,669 | 1518 | 26,267 | 327,100 | 17.3 | 1291 |
| උතුරු | 8,884 | 1,152 | 689 | 24,629 | 267,200 | 5.8 | 1016 |
| වයඹ | 7,888 | 2,563 | 1653 | 28,800 | 294,400 | 11.0 | 1488 |
| උතුරු මැද | 10,472 | 1,386 | 876 | 26,323 | 144,900 | 4.5 | 1338 |
| ඌව | 8,500 | 1,387 | 812 | 22,343 | 378,500 | 5.5 | 1517 |
| සබරගමුව | 4,968 | 2,070 | 1188 | 23,517 | 468,100 | 9.5 | 1463 |
| නැගෙනහිර | 9,996 | 1,746 | 849 | 25,000 | 316,300 | 6.5 | 1095 |
| ශ්‍රී ලංකාව | **65,610** | **21,919** | **14973** | **28,465** | **3,042,300** | **100.0** | **1070** |

**මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

ඉහත සඳහන් දර්ශක උපයෝගී කරගනිමින් සකස් කරන ලද පහත දැක්වෙන 05 වන වගුවේ 02 වන තීරුවේ සඳහන් සංයුක්ත දර්ශකයට අනුව ගණනය කරන ලද එහි 03 වන තීරුවේ දැක්වෙන ප්‍රතිශතයන්ට අනුව ප්‍රාග්ධන ප්‍රතිපාදන පළාත් අතර බෙදා දීම මැනවැයි මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලැබේ.

**වගුව 05: සංයුක්ත දර්ශක අගයයන් සහ එක් එක් පළාත සඳහා අරමුදල් වෙන්කිරීම උදෙසා භාවිතා කරන ලද ප්‍රතිශතයන්**

| පළාත | සංයුක්ත දර්ශක අගයන් | බෙදා වෙන්කරනු ලබන ප්‍රතිශත |
|---|---|---|
| බස්නාහිර | 0.67633 | 7.42 |
| මධ්‍යම | 1.01174 | 11.11 |
| දකුණු | 0.92192 | 10.12 |
| උතුරු | 1.17369 | 12.88 |
| වයඹ | 0.91576 | 10.05 |
| උතුරු මැද | 1.04349 | 11.45 |
| ඌව | 1.12125 | 12.31 |
| සබරගමුව | 1.09137 | 11.98 |
| නැගෙනහිර | 1.15499 | 12.68 |
| | | **100.00** |

මේ අනුව, පළාත් සභා සඳහා 2023 වර්ෂයට අදාලව මුදල් කොමිෂන් සභාව විසින් පහත සඳහන් ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රමාණයන් නිර්දේශ කරනු ලැබේ.

**වගුව – 06: පළාත් සභා සඳහා නිර්දේශ කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන- 2023**

| පළාත | ප්‍රාග්ධන ප්‍රදාන (රු. මිලියන) | | | | % |
|---|---|---|---|---|---|
| | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | උපමාන පාදක ප්‍රදාන | ආදායම් කාර්යසාධන ප්‍රදාන | එකතුව | |
| බස්නාහිර | 11,055 | 1,113 | 223 | 12,391 | 7.42 |
| මධ්‍යම | 16,554 | 1,666 | 333 | 18,553 | 11.11 |
| දකුණු | 15,079 | 1,518 | 304 | 16,901 | 10.12 |
| උතුරු | 19,191 | 1,932 | 386 | 21,509 | 12.88 |
| වයඹ | 14,975 | 1,507 | 302 | 16,784 | 10.05 |
| උතුරු මැද | 17,061 | 1,718 | 344 | 19,123 | 11.45 |
| ඌව | 18,342 | 1,847 | 369 | 20,558 | 12.31 |
| සබරගමුව | 17,850 | 1,797 | 359 | 20,006 | 11.98 |
| නැගෙනහිර | 18,893 | 1,902 | 380 | 21,175 | 12.68 |
| **එකතුව** | **149,000** | **15,000** | **3,000** | **167,000** | **100.00** |

එක් එක් පළාතට ලබාදීමට නියමිත පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වාර්ෂික සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී පළාතේ සෑම අංශයක්ම සංවර්ධනය කරන බව තහවුරු කිරීමේත් පළාත් අතර පොදු සැලසුම් රාමුවක් පවත්වා ගැනීමේත් අරමුණින් මුදල් කොමිෂන් සභාව විසින් මාර්ගෝපදේශ මාලාවක් නිකුත් කරනු ලැබේ. සාමාන්‍යයෙන් අදාල පාර්ශ්වකරුවන් සමඟ සිදු කරන උපදේශන ක්‍රියාවලියෙන් පසුව, පළාත් සභාව විසින් සකස් කරනු ලබන වාර්ෂික සංවර්ධන සැලැස්ම සඳහා එකඟතාවය ලබා දීමට මුදල් කොමිෂන් සභාව විසින් ක්‍රියා කරනු ඇත.

### 3.5.2 පළාත් සඳහා සාමූහික ප්‍රදාන නිර්දේශ කිරීම

පළාත් සභාවල පුනරාවර්තන ස්වරූපයේ ප්‍රදාන සම්පූර්ණයෙන්ම තක්සේරු කරන ලද පළාත් සභා වල පුනරාවර්තන අවශ්‍යතාවයේ මුළු වටිනාකමත්, එම පළාත් සභාවේ ඇස්තමේන්තු ගත ආදායමත් මහා භාණ්ඩාගාරය විසින් පළාත් සභා වෙත මාරු කරන ලද ආදායමත් මත පදනම් වේ. අදාල පළාත් සභා නිලධාරීන්ගේද ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේද සහභාගිත්වයෙන් සිදු කරනු ලබන සමාලෝචන සාකච්ඡා මගින් මුදල් කොමිෂන් සභාව විසින් පළාතේ වියදම් අවශ්‍යතාවය හා පළාත් සභා වෙත බලය පවරා දෙනු ලැබූ ආදායම් ප්‍රභවයන්ට අදාල ආදායම් ඉලක්ක තක්සේරු කරනු ලැබේ.

මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සභා සඳහා සාමූහික ප්‍රදානය නිර්දේශ කිරීමේ දී තක්සේරු කරන ලද පුනරාවර්තන වියදම සහ ඇස්තමේන්තු කරන ලද පළාත් සභා විමධ්‍යගත ආදායම මෙන්ම භාණ්ඩාගාරයෙන් සිදු කිරීමට අපේක්ෂිත ආදායම් මාරු කිරීම් යන දෙකේම එකතුව අතර පරතරය සැලකිල්ලට ගනු ලැබේ. රජයෙන් පළාත්වලට මාරු කෙරෙන ආදායම ඇස්තමේන්තුගත මුළු පළාත් සභා ආදායමෙන් ඉතා සුළු ප්‍රමාණයකි. ඒ පිළිබඳව තොරතුරු රාජ්‍ය මුල්‍ය දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් ඉදිරිපත් කර නොමැති බැවින් 07 වන වගුවේ 03 වන තීරුවෙහි එම අගයන් ඇතුළත් කර නොමැත.

මේ අනුව 2023 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන සාමූහික ප්‍රතිපාදනය පහත දක්වා ඇත.

වගුව 07: 2023 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශිත සාමූහික ප්‍රදාන

(Rs.000)

| පළාත | ** මුළු පුනරාවර්තන වියදම | ** විමධ්‍යගත ආදායම් ඉලක්ක | මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශිත සාමූහික ප්‍රදාන (රජයේ ආදායම් මාරුකිරීම් හැර) |
|---|---|---|---|
| '(1) | '(2) | '(3) | (4)= (2) -(3) |
| බස්නාහිර | 89,209,001 | 6,555,809 | 82,653,192 |
| මධ්‍යම | 55,832,183 | 2,100,000 | 53,732,183 |
| දකුණු | 59,574,107 | 1,782,891 | 57,791,216 |
| උතුරු | 41,460,869 | 1,148,500 | 40,312,369 |
| වයඹ | 56,193,090 | 2,564,800 | 53,628,290 |
| උතුරු මැද | 34,285,783 | 1,355,000 | 32,930,783 |
| ඌව | 36,860,280 | 830,000 | 36,030,280 |
| සබරගමුව | 51,323,371 | 1,360,000 | 49,963,371 |
| නැගෙනහිර | 45,344,950 | 850,000 | 44,494,950 |
| **එකතුව** | **470,083,633** | **18,547,000** | **451,536,633** |

**සටහන: ** මුද්දර ගාස්තු හා උසාවි දඩ ඇතුළත් නොවේ.**

**** මුළු පුනරාවර්තන වියදම - පළාත් ව්‍යවස්ථාපිත අධිකාරි සඳහා පුද්ගල පඩිනඩි, රේඛීය අමාත්‍යාංශ බඳවා ගැනීම් සඳහා පුද්ගල වේතන හා හිඟ වැටුප් ඇතුළත් වේ.**

සාමූහික ප්‍රදානයේ ප්‍රමාණය තීරණය කිරීමේ දී, මහා භාණ්ඩාගාරය විසින්, පළාත් විසින් රැස් කරනු ලබන ආදායම හා භාණ්ඩාගාරයෙන් කෙරෙන ආදායම් මාරු කිරීම් යන දෙකෙහි එකතුව මුළු ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදමින් අඩු කරනු ලැබේ. මේ අනුව 2023 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත සාමූහික ප්‍රදානය වන රුපියල් මිලියන 451,536.633 ප්‍රමාණය ඉහත වගුවේ අවසාන තීරුවේ දක්වා ඇත. (මීට අදාලව අප විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශය 04 වන පරිච්ඡේදයේ 07 වන අයිතමය යටතේ දැක්වේ.) විකල්පයක් ලෙස පළාත් සභා සඳහා ඔවුන්ගේ ආදායමින් 40% ක් අත්තිකාරම් බී ගිණුමේ පරතරය පියවීමට හා අනෙකුත් හදිසි අවශ්‍යතාවන් සඳහා භාවිතා කිරීමට පළාත් සභාවලට ඉඩදිය යුතු යැයි යෝජනා කර ඇත.

ඒ අනුව මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සභා සඳහා 2023 වර්ෂය වෙනුවෙන් නිර්දේශ කරන මුළු ප්‍රදානයන් (ප්‍රාග්ධන හා පුනරාවර්තන) රුපියල් මිලියන 618,536.6 වේ.

## 4 වන පරිච්ඡේදය

## පළාත් මට්ටමින් සිදු කෙරෙන සම්පත් වෙන් කිරීමේ හා සේවා සැපයීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා වන යෝජනාවන්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (4) (අ) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව මුදල් කොමිෂන් සභාව විසින් 2022 වසර සඳහා වූ මුදල් කොමිෂන් සභාවේ නිර්දේශයන් ගරු ජනාධිපතිතුමන් වෙත ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී පළාත් මට්ටමින් වඩාත් අර්ථාන්විත ලෙස සම්පත් වෙන් කිරීම සහ සීමිත සම්පත් උපයෝජනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා වූ යම් යම් යෝජනාවන් ද එහි අන්තර්ගත කරන ලදී. මූලික වශයෙන්ම කොවිඩ්-19 ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් මෙරට මුහුණපාමින් සිටි ඉතා බරපතල මූල්‍ය දුෂ්කරතාවයන් නිසා එබඳු යෝජනා ඉදිරිපත් කිරීමේ දැඩි අවශ්‍යතාවයක් තිබිණ. එම වාර්තාවේ අන්තර්ගත වූ අනෙකුත් නිර්දේශයන් සමඟ මෙකී යෝජනාවන් ද ගරු ජනාධිපතිතුමන් විසින් පිළිගෙන, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලදුව අනතුරුව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී. කෙසේවුවද, උක්ත නිර්දේශයන් අතුරින්, කිසිදු අමතර වියදමක් දැරීමකින් තොරවම ක්‍රියාත්මක කළ හැකිව තිබූ එහෙත් දිගු කාලීන ප්‍රතිඵල සාක්ෂාත් කරගත හැකිව තිබූ යම් යම් නිර්දේශයන් පවා ක්‍රියාත්මක නොවීය. එබැවින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාරව, අප විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශයන් සමඟ සාම්ප්‍රදායිකව ඉදිරිපත් කරනු ලබන ප්‍රතිපත්තිමය නිර්දේශයන් වෙනුවට, සීමිත සම්පත් ඉතා සුපරික්ෂාකාරීව හා මූල්‍ය විනයකින් යුතුව වැය කිරීම සඳහා වූ සාමූහික ප්‍රයත්නයක අවශ්‍යතාව සැලකිල්ලට ගෙන ඉදිරිපත් කරනු ලබන යම් යම් නව යෝජනාවන් ද මෙම පරිච්ඡේදය තුළ ඉදිරිපත් කිරීමට අපි අදහස් කරන්නෙමු. මින් පෙර ඉදිරිපත් කරන ලද නමුත් ක්‍රියාත්මක නොවූ යම් යම් යෝජනාවන් ද මෙම පරිච්ඡේදය තුළ අදාල වන අවස්ථාවන්හිදී නැවතත් අවධාරණය කරනු ලැබේ.

### 01. පවත්නා සම්පත් සීමාව තුළම තුලිත ප්‍රාදේශීය සංවර්ධනය සඳහා වඩාත් අර්ථාන්විත ලෙස සම්පත් වෙන් කිරීම:

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මුදල් කොමිෂන් සභාව වෙත පවරා දී ඇති මූලික කාර්යභාරය වනුයේ, පවත්නා සීමිත සම්පත් වඩාත් අර්ථාන්විත ලෙස වෙන් කිරීමට දායක වීම තුළින් තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීම උදෙසා දායකත්වය ලබාදීම වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පළාත් සභා වෙත පවරා දී ඇති විෂයයන් සඳහා එකී ආයතන වෙත වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බව කොමිෂන් සභාවට ඒත්තු ගොස් ඇති බැවින්, මෙම ආයතනයන් සඳහා බලය පවරන ලද විෂයයන්ට අදාලව ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා දිය යුතු බවට පසුගිය වසරේ දී නිර්දේශ කරන ලදී. මෙම නිර්දේශය ප්‍රතිපත්තිමය කරුණක් වශයෙන් නැවත වරක් ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාව නැඹුරු වූයේ එම යෝජනාව, පවත්නා සම්පත් සීමාව තුළම ක්‍රියාත්මක කළ හැකි බව කොමිෂන් සභාව අදහස් කරන බැවිනි. එසේ කළ හැක්කේ පළාත් සභා වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පවරන ලද විෂයයන්ට අදාලව රේඛීය අමාත්‍යාංශ වෙත ප්‍රතිපාදන ලබාදීමෙන් වැළකී එම ප්‍රතිපාදන බලය පවරන ලද විෂයයන් සඳහා පළාත් සභාවට ලබාදීම මගිනි. එබැවින්, බලය පවරන ලද විෂයයන් සඳහා වූ ප්‍රතිපාදන ලැබීමේ හිමිකම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන මගින්ම පළාත් සභා වෙත ලැබී ඇති බව සැලකිල්ලට ගනිමින් පළාත් සභා වෙත පවරා දී ඇති විෂයයන්ට අදාළව වෙන් කෙරෙන සියලුම ප්‍රතිපාදනයන් පළාත් සභා වෙතම ලබා දිය යුතු බවට කොමිෂන් සභාව විසින් නිර්දේශ කෙරේ.

**02. ජාතික හා පළාත් මට්ටමින් වඩාත් අර්ථාන්විත ලෙස ප්‍රතිපාදන වෙන් කිරීම නියාමනය කිරීම සඳහා පූර්ණ බලතල සහිත ආයතනයක් ස්ථාපිත කිරීම:**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (5) වගන්තියෙහි දක්වා ඇති තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීම පළාත් සභාවන්ට පමණක් තනිවම කළ නොහැකි බව අපගේ මින් පෙර නිර්දේශයන්හි දී සඳහන් කරන ලදී. ඊට බලපාන කරුණු පහත පරිදි වේ.

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පළාත් සභාවන්ට පවරා ඇති විෂයයන් සඳහා එකී ආයතනවලට ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණය එම විෂයන් සඳහාම රේඛීය අමාත්‍යාංශය/ආයතන වෙත ලැබෙන ප්‍රතිපාදනයන්ට වඩා සාපේක්ෂව ඉතා අඩු මට්ටමක පැවතීම.

(ආ) ප්‍රාදේශීය සංවර්ධනය අරමුණු කොටගෙන (මධ්‍යම) රජයට අයත් රේඛීය අමාත්‍යාංශ/ආයතන ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා ව්‍යාපෘතීන් පළාත් සභාවන්හි භූගෝලීය සීමාවන්ගෙන් එපිටට විහිදීම.

(ඇ) උක්ත "අ" සහ "ආ" ප්‍රකාරව පළාත් සභා සඳහා සම්පත් වෙන් කර දීමේදී මුදල් කොමිෂන් සභාව විසින් ප්‍රාදේශීය විෂමතාවයන් පාදක කොටගත් නිර්ණායකයන් අනුගමනය කරනු ලබන නමුත් රජයට අයත් රේඛීය අමාත්‍යාංශ/ආයතන විසින් ප්‍රාදේශීය මට්ටමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී එවැනි ක්‍රමවේදයන් අනුගමනය කරනු ලබන අවස්ථා විරල වීම.

(ඈ) ප්‍රමුඛ අවශ්‍යතා සහිත අංශයන් කෙරෙහි ප්‍රතිපාදන යෙදවීම මෙන්ම කාර්යය ද්වීකරණයවීම සහ අතිච්ඡාදනයවීම වැළැක්වීම සඳහා වූ ඒකාබද්ධ සැලසුම්කරණ යාන්ත්‍රණයක් ජාතික සහ පළාත් මට්ටම තුළ නොපැවතීම.

ඉහත කරුණුවලට අමතරව, ස්වාධීන හා ශක්තිමත් ව්‍යාපෘති ඇගයුම් ක්‍රමවේදයක් යොදා ගනිමින් ආයෝජන යෝජනා ඇගයීමට ලක් කිරීම තුළින් ඉහළ ආර්ථික ප්‍රතිලාභ ලබාදෙන ව්‍යාපෘතීන් පමණක් ක්‍රියාත්මක කරන බව සනාථ කොට ගැනීම වත්මන් ණය අර්බුදය හමුවේ උද්ගතව ඇති ඉතා දැඩි අවශ්‍යතාවයකි. එවැනි ව්‍යාපෘති ඇගයුම් ක්‍රමවේදයක් නොමැතිවීම හේතුවෙන් සාමාන්‍යයෙන් ඉහළ ආර්ථික ප්‍රතිලාභ සහිත ව්‍යාපෘතීන් තෝරාගැනීම වෙනුවට, ප්‍රතිලාභ ජනනය කිරීමට ඉතා දිගු කාලයක් ගතවන්නාවූ ව්‍යාපෘතීන් සඳහා වාණිජමය පොළී අනුපාතයන් යටතේ ලබා ගන්නා ලද අරමුදල් ආයෝජනය කිරීම වත්මන් අර්බුදකාරී තත්ත්වය නිර්මාණය වීමට හේතු වූ බවද මෙහිදී සැලකිල්ලට ගත යුතුව ඇත.

ඒ අනුව, ඒකාබද්ධ සැලසුම්කරණ යාන්ත්‍රණයකට අනුගත වීම සම්බන්ධව අප විසින් පෙර වසරේ ඉදිරිපත් කරන ලද නිර්දේශයන් නැවතත් අවධාරණය කරනු ලබන අතරම සමස්තයක් වශයෙන් සම්පත් විවිධ ක්ෂේත්‍ර හා විවිධ මට්ටම් වලට වෙන් කර දීම සහ ව්‍යාපෘතීන් ප්‍රමුඛතාගත කිරීම සම්බන්ධව පූර්ණ බලතල සහිත, පෙර පැවති ඉන්දියානු සැලසුම්කරණ කොමිෂන් සභාව වැනි වූ බලතල සහිත ස්වාධීන ආයතනයක් ස්ථාපිත කිරීම සුදුසු බව මෙම කොමිෂන් සභාව විසින් යෝජනා කෙරේ. මූලික වශයෙන් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සහ මුදල් කොමිෂන් සභාව එකට එක්කිරීමෙන් සහ අදාල අනෙකුත් ආයතනයන්හි සේවාවන්ද සුදුසු පරිදි ලබාගැනීමෙන් එවැනි ආයතනයක් නිර්මාණය කිරීමේ හැකියාව පවතී. මෙම යෝජනාවට රජයේ අනුමැතිය ලැබෙන්නේ නම්, මේ සඳහා අවශ්‍ය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ඇතුළත් සංකල්ප පත්‍රිකාවක් මුදල් කොමිෂන් සභාව සහ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව එක්ව සකස් කිරීමේ හැකියාව පවතී.

**03. පළාත් කාර්ය මණ්ඩලය මනාව කළමනාකරණය කිරීම:**

මෙම වසර සඳහා වූ ප්‍රතිශෝධිත අයවැය මගින් යෝජනා කොට ඇති රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩල සමාලෝචනය මීට බොහෝ කලකට පෙර සිදු කළ යුතුව තිබූ බව කොමිෂන් සභාවේ හැඟීමයි. කෙසේවුවද, රාජ්‍ය සේවයේ ප්‍රාථමික මට්ටම කේන්ද්‍ර කොටගෙන මෙය ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කරගත හැකිවේදැයි සැකයක් පවතී. වර්තමානයේ දක්නට ලැබෙන දියුණු තොරතුරු තාක්ෂණ ක්‍රමවේදයන් භාවිතා කිරීම මෙන්ම මීට පෙර අදාල ආයතනයන්හිම සේවක මණ්ඩලය විසින්ම ඉටු කරන ලද යම් යම් සේවාවන් මේ වන විට බාහිර පාර්ශවයන් වෙත පැවරීම (Outsourcing) වැනි තත්ත්වයන් පුරෝකථනය කොට නොතිබූ බැවින්, බොහෝ කලකට පෙර අනුමත කොට, මේ දක්වා පවත්වාගෙන යනු ලබන සේවක සංඛ්‍යාව තුළින් වර්තමානයේ පවත්නා සත්‍ය අවශ්‍යතාව ගම්‍ය නොවේ. මෙරට ආර්ථිකය ඉහළ වර්ධනයක් අරමුණු කොටගත් මාවතකට යොමු කිරීම සඳහා රාජ්‍ය සේවය ප්‍රතිව්‍යුහගත කිරීම අත්‍යාවශ්‍ය වේ. එබැවින්, යෝජිත කාර්ය මණ්ඩල සමාලෝචනය සමස්ත රාජ්‍ය සේවයම ආවරණය වන පරිදි පුළුල් ක්‍රමවේදයකින් ඉටු කළ යුතු බව කොමිෂන් සභාව විසින් අවධාරණයෙන් යුතුව නිර්දේශ කෙරේ. එමෙන්ම, සමස්ත සේවක පිරිසම ඵලදායී ලෙස සේවයෙහි යෙදවීම සඳහා භාවිතයට ගත හැකි වන පරිදි සමස්ත සේවක සංඛ්‍යාව ම ආවරණය වන ආකාරයේ කළමනාකරණ තොරුතුරු පද්ධතියක් (MIS) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සකස් කිරීම හා පවත්වාගෙන යෑම සුදුසු බව ද කොමිෂන් සභාව විසින් යෝජනා කරනු ලැබේ.

**04. සංවර්ධන පාර්ශවකාර ආයතනයන් විසින් ලබාදෙන අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් සඳහා ව්‍යාපෘති කාර්යාල ස්ථාපිත කිරීමෙන් වැළකීම:**

මෙබඳු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී, ව්‍යාපෘති කාර්යාල පිහිටුවීම වෙනුවට පළාත් සභාවන්හි කාර්ය මණ්ඩලයන් යොදා ගෙන අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සුදුසු බව පසුගිය වසරේ ඉදිරිපත් කරන ලද අපගේ නිර්දේශයන්හිද අවධාරණය කෙරිණ. මනාව සංවර්ධිත ආයතනික සැකැස්මක් සහ බහුවිධ හැකියාවන්ගෙන් පිරිපුන් මානව සම්පතක් පළාත් සභාවන් සතුව පවත්නා නමුත් ඔවුන්ගේ හැකියාවන් පූර්ණ වශයෙන් භාවිතයට නොගන්නා බවත්, පළාත් සභාවන් වෙත ප්‍රමාණවත් තරම් ප්‍රාග්ධන ප්‍රදානයන් නොලැබීම මීට ප්‍රධාන හේතුව බවත් අපගේ මතයයි. සත්‍ය වශයෙන්ම, ව්‍යාපෘති කාර්යාල පිහිටුවීමේ දී රේඛීය අමාත්‍යාංශ විසින් කරනු ලබන්නේ රාජ්‍ය සේවයෙන් පරිබාහිර පිරිස් සේවයේ යෙදවීම හෝ පළාත් සභාවේ සේවයෙහි නියුතු කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ වැටුපට අමතරව දීමනාවක් ලබා දී ඔවුන්ව ද්විතීයන පදනම මත අදාල ව්‍යාපෘති කාර්යයන් සඳහා යොදා ගැනීමයි. ව්‍යාපෘති කාර්යාල මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ව්‍යාපෘති පරිපාලනයේ දී දැරීමට සිදුවන පිරිවැයට අමතරව, විශේෂයෙන්ම ව්‍යාපෘතිය අවසානයේදී උද්ගත වන විවිධාකාරයේ ගැටළුකාරී අවස්ථාවන් කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. ප්‍රධානතම ගැටළුව වනුයේ අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී සිදු වූ යම් යම් අඩුලුහුඩුකම් පිළිබඳව ව්‍යාපෘති කාර්යමණ්ඩලය වෙත වගකීම පැවරීමේ දී මතුවන දුෂ්කරතාවයි. ව්‍යාපෘතීන් සඳහා මුදල් යෙදවීමේ දී විදේශාධාර සපයන ආයතන සතුව බිම් මට්ටම පිළිබඳව නිසි අවබෝධයක් නොමැතිවීම හේතුවෙන් ඔවුන් විසින් ව්‍යාපෘති කාර්යාල පිහිටුවීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම සාමාන්‍ය ක්‍රමවේදය වේ. ඒ අනුව, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවන ලද ව්‍යාපෘති කාර්යාල ගණනාවක්ම සීමා කිරීමට රජය උත්සුක වීම අතිශයින් අගය කරන මෙම කොමිෂන් සභාව මේ සම්බන්ධව රජය විසින් දැඩි ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම මැනවයි නිර්දේශ කෙරේ. ඒ අනුව විවිධ ව්‍යාපෘතීන් සඳහා විදේශ ආධාර ලබා ගැනීමට එකඟ වන අවස්ථාවේදීම, ව්‍යාපෘති කාර්යාල පිහිටුවීම වෙනුවට හැකිතාක් දුරට පළාත් සභාවන්හි කාර්ය මණ්ඩලය යොදවා එකී ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට හැකි බව ආධාර ලබාදෙන ආයතන වෙත ඒත්තු ගැන්වීමට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට හැකියාව ලැබෙනු ඇත.

**05.** **ප්‍රධාන ලේකම්වරුන් ඍජුවම පාර්ලිමේන්තුව වෙත වගවන ක්‍රමවේදයක් සැකසීම :**

පළාත් සභාවන් විශේෂ වියදම් ඒකක වශයෙන් විසර්ජන පනතෙහි ඇතුළත් කොට ප්‍රධාන ලේකම්වරුන් ඍජුවම පාර්ලිමේන්තුව වෙත වගවන ක්‍රමවේදයක් සකස් කළ යුතු බවට මීට පෙර අවස්ථා දෙකකදීම අප විසින් යෝජනා කරන ලදී. පළාත් රාජ්‍ය සේවය මෙන්ම පළාත් අයවැය ද මනාව කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් පළාත් ප්‍රධාන ලේකම්වරුන් වගකිව යුතු බැවින් ප්‍රධාන ලේකම්වරුන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් ලෙස පත්කිරීම සම්බන්ධ යෝජනාව යුක්ති සහගත වේ. එමෙන්ම, රේඛීය අමාත්‍යාංශයන්හි ලේකම්වරුන් පත්කරන ආකාරයටම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ප්‍රතිපාදන ප්‍රකාරව, ප්‍රධාන ලේකම්වරුන් පත් කරනු ලබන්නේ ද ගරු ජනාධිපතිතුමන් විසින්ම වන බැවින්, ප්‍රධාන ලේකම්වරුන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් ලෙස නම් කිරීමේ යෝජනාව තවදුරටත් සාධාරණීකරණය කළ හැක. නීතිමය තත්ත්වය සලකා බැලීමේදී ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (1) (අ) අනුව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන අමාත්‍යාංශයන්හි විෂය පථයන් දැක්වෙන ගැසට් නිවේදනයෙහි ද රේඛීය අමාත්‍යාංශයක් යටතේ පළාත් සභාවන් වර්ගීකරණය කොට දක්වා නොමැති පසුබිමක, පළාත් සභාවන් රේඛීය අමාත්‍යාංශයන් යටතේ ''වැය ඒකක'' ලෙස දැක්වීමේ වත්මන් භාවිතය කෙතරම් උචිතදැයි යම් අයෙකුට ප්‍රශ්න කළ හැකි බව ද පෙන්වාදීම යෝග්‍ය වේ. මෙම කරුණු සැලකිල්ලට ගෙන, මෙම යෝජනාව මෙම වසරේදී නැවතත් ඉදිරිපත් කරනු ලැබේ.

**06.** **රෝහල් සහ අනෙකුත් සෞඛ්‍ය සේවා සපයන ආයතන පිහිටුවීමේ / පුළුල් කිරීමේ ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමේ අවශ්‍යතාවය:**

ප්‍රධාන නගරයන්හි රෝහල් සඳහා අධික තදබදයක් පවත්නා බවත්, නාගරික ප්‍රදේශවලින් බැහැරව පිහිටි රෝහල් සහ අනෙකුත් සෞඛ්‍ය සේවා සපයන ආයතන බෙහෙවින්ම ඌණ-උපයෝජිත තත්ත්වයේ පවත්නා බවත් සෞඛ්‍ය බලධාරීන් විසින් පෙන්වා දී ඇත. එමෙන්ම, පසුව කී කාණ්ඩයේ රෝහල් සඳහා ද නවීන උපකරණ මෙන්ම සෞඛ්‍ය සේවා සම්බන්ධ වෘත්තීය නිපුණත්වය සහිත පුද්ගලයින් අනුයුක්ත කරන ලෙස රජයට විශාල පීඩනයක් එල්ල වී ඇත. ප්‍රධාන රෝහල්වල සේවය කරන සෞඛ්‍ය/වෛද්‍ය වෘත්තිකයින් හට ලබාදෙන සියලුම අතිරේක වරප්‍රසාදයන් අනෙකුත් රෝහල්වල සේවය කරන එකී කාර්ය මණ්ඩලය වෙත ලබාදීම සඳහා විශාල වියදමක් දැරීමට ද සිදුව ඇත. පසුගිය දශක දෙක තුළ විශාල වශයෙන් සිදු කරන ලද ආයෝජනයන් හරහා ඉදි කොට ඇති නවීන මාර්ග පද්ධතියක් තුලින් රටේ සෑම ප්‍රදේශයක්ම වාගේ එකිනෙකට යා කොට ඇත. මෙමගින් නාගරික ප්‍රදේශවලින් බැහැරව ජීවත් වන රෝගීන්ට ප්‍රධාන නගරවල ඇති රෝහල් වෙත පහසුවෙන් ළඟා වීමේ හැකියාව බොහෝ දුරට ලැබී ඇත. විශේෂයෙන්ම කොවිඩ් වසංගත තත්ත්වය තුළ දී සිය කාර්යක්ෂමතාව මනාව පිළිබිඹු කරන ලද ''සුවසැරිය'' ජංගම ගිලන්රථ සේවාව මෙම තත්ත්වය තවදුරටත් සාධනීය ලෙස වර්ධනය කිරීමට දායක වී ඇත. රේඛීය අමාත්‍යාංශ හෝ පළාත් සභාවන් විසින් රෝහල් හෝ සෞඛ්‍ය සේවා සපයන ආයතන ස්ථාපිත කිරීමේ දී හෝ පුළුල් කිරීමේ දී මෙම කරුණු අවධානයට ගෙන ඇත්දැයි යන්න එතරම් පැහැදිලි නැත. එබැවින්, රෝහල් ඇතුළු රාජ්‍ය අංශයේ සෞඛ්‍ය සේවා සපයන ආයතන ස්ථාපිත කිරීම හෝ පුළුල් කිරීමට අදාලව විධිමත් ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා විස්තරාත්මක හා ස්වාධීන අධ්‍යයනයක් රජය විසින් සිදු කිරීම මැනවැයි මෙම කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලැබේ.

**07.** **බලතල බෙදා හැරීම හා සබැඳි සංවර්ධන පරමාර්ථ සමඟ පළාත් සභාවන්හි ආදායම් උත්පාදනය සම්බන්ධ කිරීම:**

යම් යම් ආදායම් ප්‍රභවයන් පළාත් සභාවන් වෙත පවරා දීමේ තාර්කික පදනම වනුයේ තුලිත ප්‍රාදේශීය සංවර්ධනය සඳහා අවශ්‍ය වන්නා වූ වියදමෙන් කොටසක් හෝ ඒ තුළින් සපුරා ගැනීමයි. කෙසේ වෙතත්, ආරම්භයේ සිටම මහා භාණ්ඩාගාරය විසින් අනුගමනය කළ ක්‍රමවේදය වනුයේ පළාත් සභාවන්හි ආදායම් මුළුමනින්ම පළාතේ පුනරාවර්තන වියදම් අවශ්‍යතාවලින් කොටසක් පියවා ගැනීමට යෙදවීමයි. (මධ්‍යම) රජය විසින් නිකුත් කරනු ලබන නීති හා රෙගුලාසි පාදක කොටගනිමින් දිවයින පුරාම ඒකාකාරව ක්‍රියාත්මක කරනු ලබන නිදහස් අධ්‍යාපනය සහ නිදහස් සෞඛ්‍ය සේවා

පද්ධතිය නඩත්තු කිරීම සඳහා පළාත්වල පුනරාවර්තන වියදම්වලින් විශාල කොටසක් (ආසන්න වශයෙන් 80%ක් පමණ) වැය වේ. මෙම භාවිතාව තුළින් පළාත් සභාවන්හි ප්‍රාදේශීය වශයෙන් සුවිශේෂී වූ ගැටළු විසඳා ගැනීම සඳහා නිර්මාණාත්මක ප්‍රවේශයකට යොමු වීමටත් පළාත් බලධාරීන්හට අවස්ථාවන් උදා නොකරයි. අනෙක් අතට රජයේ පාසල් (බහුතරයක් නගරවල ස්ථාපිතව ඇති) මහජනතාවගේ බදු ආදායමින් නඩත්තු වන පසුබිමක, පළාත් සභාවන්හි පාසල්, රෝහල් හා අනෙකුත් ග්‍රාමීය සෞඛ්‍ය සැපයුම් ආයතන නඩත්තුව සඳහා පළාත් සභාවන්හි ආදායම් යෙදවීමට සිදු වීම තුළ යම් විෂමතාවයන් පවත්නා බව පෙනී යයි. නිදහස් සෞඛ්‍ය හා නිදහස් අධ්‍යාපනය සැපයීම ජාතික ප්‍රතිපත්තියක් වශයෙන් රට පුරාම ඒකාකාරව ක්‍රියාත්මක වන බැවින්, එම පිරිවැයෙහි පළාත් සංරචකය ද රජය විසින්ම දරමින්, පළාත් සභාවන් විසින් උපයන ආදායම අනෙකුත් අංශයන්හි සංවර්ධනය සඳහා යෙදවීමට පළාත් සභාවන්ට අවස්ථාව සැලසීම උචිත බව මෙම කොමිෂන් සභාව විසින් යෝජනා කෙරේ. මෙම යෝජිත ක්‍රමවේදය හරහා වුවද, රජයට සිදුවන සමස්ත බලපෑම එකම වන නමුදු, එමගින් ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම උදෙසා දායක වන අනෙකුත් අංශයන් (අධ්‍යාපනය සහ සෞඛ්‍යය හැර) සංවර්ධනය කිරීම සඳහා පළාත් සභාවන්හි ආදායම් තුළින් වැඩි දායකත්වයක් ලබාදීමට පළාත් බලධාරීන්ට අවකාශය සැලසේ.

පළාත් සභාවන්හි අත්තිකාරම් 'බී' ගිණුමෙහි පවත්නා විශාල පරතරය අඩු කර ගැනීම සඳහා පසුගිය වසරේ දී අප විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය සම්පත් මහා භාණ්ඩාගාරය සතු නොවන බැවින්, ලබන වසරේ සිට පළාත් සභාවන්හි ආදායමෙන් 40% ක් එම කාර්යය සඳහා යොදා ගැනීමට ඔවුනට අවකාශ සලසා දීම සුදුසු බව විකල්පයක් ලෙස යෝජනා කිරීමට ද කොමිෂන් සභාව අපේක්ෂා කරයි. මෙමගින් (මධ්‍යම) රජයේ නිලධාරීන්ට සාපේක්ෂව ඒ හා සම මට්ටමේ සිටින පළාත් රාජ්‍ය නිලධාරීන් මුහුණ දෙන කැපී පෙනෙන විෂමතාව මග හැරී යනු ඇත.

**08. ජාතික අමාත්‍යාංශයන්හි විෂය පථයන් යටතේ බලය පවරන ලද විෂයන් හා සබැඳි ක්‍රියාකාරකම් ඇතුළත් කිරීමෙන් වැළකීම :**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් යම් යම් බලතල හා වගකීම පළාත් සභාවන්ට පවරන ලද අතර, සමගාමී ලැයිස්තුවේ සහ සංචෘත ලැයිස්තුවේ විෂයන්ට අමතරව, පළාත් සභා වෙත බලය පවරන ලද විෂයන් සම්බන්ධයෙන්ද ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ බලතල මධ්‍යම රජය වෙත හිමිව ඇත. තම ආයතන වෙත පවරා දෙනු ලැබූ විෂයන් යටතේ වූ සංවර්ධන ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන මානව හා භෞතික සම්පත්වලින් අනූන ශක්තිමත් ආයතනික සැකැස්මක් පළාත් සභාවන් විසින් ක්‍රමිකව සංවර්ධනය කොටගෙන ඇත. කෙසේවුවද, බොහෝ රේඛීය අමාත්‍යාංශයන් විසින් පළාත් සභා වෙත බලය පවරන ලද විෂයන්ට අයත් වන ව්‍යාපෘතීන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ නැඹුරුවක් පවත්නා බව මුදල් කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලදී. බොහෝ අවස්ථාවන්හි දී රේඛීය අමාත්‍යාංශ සතුව උක්ත ව්‍යාපෘතීන්/ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත හැකි යාන්ත්‍රණයක් පළාත් මට්ටමේ නොමැති බැවින් සිය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභාවන්හි හෝ දිස්ත්‍රික් පරිපාලනයේ පරිපාලනමය ව්‍යුහය මත යැපීමට හෝ ඉහත අංක 04 යටතේ සඳහන් කරන ලද පරිදි, විශේෂිතව පිහිටුවූ ව්‍යාපෘති කාර්යාල ස්ථාපිත කිරීමට ඔවුනට සිදුවේ. මෙමගින් එම ක්‍රියාකාරකම් ද්විකරණයවීම හා අතිච්ඡාදනයවීම මෙන්ම ඒ හරහා නාස්තිය හා අකාර්යක්ෂමතාව ඉහළ යාම ද සිදු වේ. පළාත් සභා වෙත පවරන ලද විෂයයන්ට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයන්ට හිමිකමක් ලැබෙනුයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (1) (අ) අනු ව්‍යවස්ථාව යටතේ නිකුත් කොට ඇති අමාත්‍යාංශයන්හි බලතල හා ක්‍රියාකාරකම් සම්බන්ධ නිවේදනයන්හි පළාත් සභාවන්ට පවරා ඇති අනෙකුත් ආනුෂාංගික විෂයන්ද එකී අමාත්‍යාංශ යටතේ සඳහන් වන බැවිනි. එබැවින්, පළාත් සභා වෙත බලතල පැවරීම වඩාත් අර්ථාන්විතවීම සඳහා පළාත් සභා වෙත පැවරුණු විෂයයන්ට අදාළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ වගකීම ඉටු කළ හැකි වන පරිදි, රේඛීය අමාත්‍යාංශයන් වෙත එකී කරුණු වලට අදාළ ප්‍රතිපත්ති

සංවර්ධනය හා සාර්ව මට්ටමේ ක්‍රමෝපායික සැලසුම්කරණය සම්බන්ධ වගකීම් පැවරීම මැනවැයි මෙම කොමිෂන් සභාව විසින් යෝජනා කරනු ලැබේ.

**09. රේඛීය අමාත්‍යාංශ විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන්හි ක්‍රියාත්මක කළ යුතු ස්ථාන/ප්‍රදේශ හඳුනාගැනීම සඳහා පළාත් සභා සමඟ සාකච්ඡා කිරීම:**

රේඛීය අමාත්‍යාංශ විසින් සමගාමී ලැයිස්තුවට හෝ පළාත් සභා ලැයිස්තුවට අයත්වන විෂයන්ට අදාල ව්‍යාපෘතීන් / ක්‍රියාකාරකම් ඉටු කිරීමේ දී (අපගේ පෙර කී නිර්දේශයන් වෙනුවට වත්මන් භාවිතාව තවදුරටත් ක්‍රියාත්මක වන්නේ නම් අනෙකුත් විෂයයන් අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ද) අදාල ව්‍යාපෘතීන් පළාත තුළ ස්ථාපිත කිරීමට සුදුසු ස්ථානයක් තීරණය කිරීම සඳහා පළාත් සභා බලධාරීන් සමඟ සාකච්ඡා කිරීම සුදුසු බව යෝජනා කෙරේ. මෙමගින් එකම ක්‍රියාකාරකම පළාත් සභාවන්හි වාර්ෂික සංවර්ධන සැලසුම්වලට ඇතුළත් කිරීම තුලින් පැන නගින ද්විකරණය හා අතිච්ඡාදනය සම්බන්ධ ගැටළු ඇතිවීම වැළකී යනු ඇත. ව්‍යාපෘතීන් ස්ථාපිත කිරීමට වඩාත්ම සුදුසු ස්ථානයන්හි ඒවා ස්ථාපිත කිරීම තුළින් එම ව්‍යාපෘති හරහා අපේක්ෂිත උපරිම ප්‍රතිලාභ ළඟාකර ගත හැකි වන බැවින් මෙසේ සාකච්ඡා පැවැත්වීම රේඛීය අමාත්‍යාංශ සහ පළාත් සභා යන දෙපාර්ශවයටම ප්‍රයෝජනවත් වනු ඇත. විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන් සඳහා ද මෙවැනිම සාකච්ඡා පැවැත්වීමේ ක්‍රමවේදයක් තිබීම අවශ්‍ය වේ.

**10. රේඛීය අමාත්‍යාංශ විසින් පළාත් රාජ්‍ය සේවයට බලපාන චක්‍රලේඛ නිකුත් කිරීමේ දී පළාත් සභා සමඟ සංවාදයක් තිබීමේ අවශ්‍යතාවය :**

පළාත් සභාවන්හි අදහස් නිසි පරිදි විමසීමකින් තොරව රේඛීය අමාත්‍යාංශ විසින් නිකුත් කරනු ලබන යම් යම් චක්‍රලේඛයන් ක්‍රියාත්මක කිරීමේ දී අරමුදල් පිළිබඳ ගැටළු හා පරිපාලනමය ගැටළු වැනි දුෂ්කරතාවයන්ට මුහුණදීමට තමන්ට සිදුවන බව පළාත් බලධාරීන් විසින් අපව දැනුම්වත් කොට ඇත. පළාත් සභාවන් සතුව කිසියම් විෂයයකට වෙන් නොකළ අතිරික්ත ප්‍රතිපාදන නොපවතින බැවින්, උක්ත චක්‍රලේඛ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන්නාවූ අතිරේක වියදම් පළාත් සභාවන්ට "ඔවුන්ගේ අරමුදල්" තුළින් දැරිය හැකි බවට උපකල්පනය කිරීම නිවැරදි නොවේ. එබැවින්, ඉහත සඳහන් කළ අන්දමේ චක්‍රලේඛ නිකුත් කිරීමේ දී, පළාත් සභාවන්ට ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලබාදීමට මහා භාණ්ඩාගාරයට හැකියාවක් පවතීද යන්න පිළිබඳව මහා භාණ්ඩාගාරයේ උපදෙස් ලබා ගැනීම ද සුදුසු බව යෝජනා කෙරේ.

**11. පළාත් සභා නිලධාරීන් මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පළාත් සභාවන්හි ධුරාවලිය නොසලකා හැරීම :**

ඇතැම් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී, රේඛීය අමාත්‍යාංශ විසින් පළාත් සභාවන්හි මධ්‍යම සහ පහළ මට්ටමේ කාර්ය මණ්ඩල සමඟ ඍජුවම ගනුදෙනු කරමින් ඉහළ මට්ටමේ පළාත් සභා බලධාරීන් මගහැර කටයුතු කිරීම සම්බන්ධව යම් යම් ආණ්ඩුකාරවරුන් සහ පළාත් බලධාරින් ඔවුන්ගේ නොසතුට පළකර ඇත. මධ්‍යම හා පහළ මට්ටමේ සේවක පිරිස් සමඟ ඍජුවම ගනුදෙනු කිරීම තුළින් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීමේ හැකියාවක් ඇති නමුත්, පළාත් සභා ධූරාවලියේ ඉහළ බලධාරීන්ගේ අනුදැනුමකින් තොරව මෙසේ සිදු කිරීම තුලින් ගැටලුකාරී තත්වයක් පැන නගී. ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර අදාල රේඛීය අමාත්‍යාංශ විසින් ආණ්ඩුකාරවරුන්, ප්‍රධාන ලේකම්වරුන් සහ අදාල පළාත් බලධාරීන් සමඟ මූලික මට්ටමේ සාකච්ඡා පවත්වා පළාත් සභාවන්හි කාර්ය මණ්ඩලය යම් යම් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගැනීම සම්බන්ධව එකඟතාවකට පැමිණීම තුළින් මෙම ගැටළුකාරී තත්ත්වය වළක්වා ගත හැක.

**12. පළාත් ආදායම් ඉහළ නැංවීම සම්බන්ධයෙන් වන බාධක ඉවත් කිරීම :**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන පරිශිෂ්ටයෙහි I වන ලැයිස්තුවෙහි පළාත් සභාවන්හි ආදායම් ප්‍රභවයන් 20 ක් (නිශ්චිත ප්‍රභවයන් 19 ක් සහ එක් බහුවිධ ප්‍රභවයක්) නිශ්චිතව දක්වා ඇත. මෙම ප්‍රභවයන් අතුරින්, පිරිවැටුම සම්බන්ධ බදු, මෝටර් රථවාහන බලපත්‍ර ගාස්තු සහ ඉඩම්, ගොඩනැගිලි සහ ඔට්ටු ඇල්ලීම් (betting) සම්බන්ධ බදු පාර්ලිමේන්තුව විසින් පනවා ඇති සීමාවන්ට යටත්ව අයකිරීමට පළාත් සභාවන්ට හැකියාවක් පවතී. මෙම ලැයිස්තුව නැවත සමාලෝචනය කොට යෝග්‍ය අවස්ථාවන්හිදී එසේ පනවා ඇති සීමාවන් තවදුරටත් ලිහිල් කිරීමේත්, බදු පදනම පුළුල් කිරීමේත් අවශ්‍යතාවය පවතී. මෙය කළ හැකිවනුයේ අදාල පාර්ශවකරුවන් සමඟ  සාකච්ඡා කොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අවශ්‍ය සංශෝධන ගෙන ඒම තුළින් වන බැවින් මෙම යෝජනාව කෙටි කාලයක් තුළ ක්‍රියාත්මක කිරීම දුෂ්කර වනු ඇත.

උක්ත බදු හා ගාස්තු එකතු කිරීමේ බලය පළාත් සභාවන් සතුව පැවතියද, ඒවායින් බොහොමයක අනු ප්‍රමාණ සහ ගාස්තු ප්‍රතිශතයන් නියම කරනු ලබන්නේ යම් යම් පනත්වල ප්‍රතිපාදන අනුව අදාල කැබිනට් අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන නිවේදන මගිනි. එබැවින්, වෙනස්වන සන්දර්භයට ගැළපෙන පරිදි, බොහෝ බදු අනු ප්‍රමාණයන් හා ගාස්තු ප්‍රතිශතයන් සංශෝධනය කිරීම පළාත් සභාවන්හි පාලනයෙන් බැහැර වූවකි. උදාහරණයක් ලෙස ගත හොත් මේ වන විට බලපවත්නා මෝටර් රථවාහන බලපත්‍ර ගාස්තු පිළිබඳ නිවේදනය පළකොට ඇත්තේ 2013 වසරේ දී වන අතර මත්පැන් අලෙවිසැල් බලපත්‍ර ගාස්තු නිශ්චය කොට ඇත්තේ 2017 වසරේදීය. එබැවින්, අනෙකුත් සංවර්ධනයන්ට සමගාමීව රේඛීය අමාත්‍යාංශ විසින් අදාල බදු අනු ප්‍රමාණ හා ගාස්තු ප්‍රමාණයන්  ප්‍රතිශෝධනය කිරීම සුදුසු බව මෙම කොමිෂන් සභාව විසින් නිර්දේශ කෙරේ.

**පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා, නිර්දේශ කිරීම, අයවැය වෙන් කිරීම, හා අක්මුදල් නිදහස් කිරීම (2017-2021)**

**(රු. මි.)**

| වර්ෂය (1) | පළාත් සභා මගින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම (2) | මුදල් කොමිෂන් සභාව මගින් නිර්දේශ කරන ලද ප්‍රමාණය (3) | අයවැය මගින් වෙන් කරන ලද ප්‍රමාණය (4) | නිදහස් කරන ලද අක්මුදල (5) | නිදහස් කරන ලද අක්මුදල, අයවැය මගින් වෙන් කරන ලද ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස (6) =5/4*100 | නිදහස් කරන ලද අක්මුදල, මුදල් කොමිෂන් සභාව මගින් නිර්දේශ කරන ලද ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස (7) = 5/3*100 |
|---|---|---|---|---|---|---|
| 2021 | 133,205 | 77,950 | 26,944 | 15,191 | 56.38 | 19.49 |
| 2020 | 102,137 | 99,000 | 15,376 | 12,756 | 82.96 | 12.88 |
| 2019 | 98,854 | 40,000 | 27,334 | 13,581 | 49.69 | 33.95 |
| 2018 | 82,588 | 57,000 | 25,788 | 16,148 | 62.62 | 28.33 |
| 2017 | 85,243 | 38,432 | 35,809 | 23,769 | 66.38 | 61.85 |
| **එකතුව** | **502,027** | **312,382** | **131,251** | **81,445** | **62.05** | **26.07** |

*මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව*